මධ්‍යම පළාත් සභාව - 2024 වර්ෂය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 ජූනි 23 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	2018 මැයි 10 දිනැති අංක 265/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02,03 වගන්තිවලට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් උපචිත පදනම මත ගිණුම්කරණ ක්‍රමය භාවිතයට ගැනීම තුළින් රාජ්‍ය අංශයේ ගුණාත්මක මූල්‍ය ගිණුම්කරණයක් හා වාර්තාකරණයක් සඳහා වූ රාමුවක් සපයන බව දක්වා ඇතත් මෙම චක්‍රලේඛය නිකුත් කර වර්ෂ 07 කට ආසන්න කාලයක් ගත වී තිබුණද මේ දක්වා මධ්‍යම පළාත් සභාවේ සියළුම ආයතන මූල්‍ය ගිණුම්කරණය සහ වාර්තාකරණය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර නොතිබුණි.	මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් මෙම වෙනස්කම් සිදු කළ වහාම මධ්‍යම පළාත තුළ අදාළ වෙනස්කම් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යටතේ පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් රු.162,134,972 ක මුදලක් සහ පරිගණක සහ අනෙකුත් උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.28,297,885 ක් වශයෙන් එකතුව රු.190,432,857 ක මුදලක් වැය කර තිබුණද එය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අත්පත් කරගැනීම් යටතේ දක්වා නොතිබුණි.	ඉදිරියේදී, නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමි.	දෙපාර්තමේන්තුවට අයත් දේපල හා වත්කම් හඳුනාගෙන, ඒවා තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.

(ඇ)	පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතු ක්‍රීඩා සංකීර්ණය, ගෘහස්ත ක්‍රීඩාංගනය, ප්‍රධාන නැරඹුම් මැදිරිය, ක්‍රීඩා පිටිය, භෝජනාගාරය, පිහිනුම් තටාකය, කායවර්ධන මධ්‍යස්ථානය, මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කලාප අධ්‍යාපන කාර්යාල 15හි හා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල 40 හි ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම්, පළාත් සභා පාසල් 1461හි ඉඩම්, ගොඩනැගිලි හා නිල නිවාසවල වටිනාකම් සහ දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 02 හි වත්කම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	අදාල තක්සේරු කටයුතු සිදුකර ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි	දෙපාර්තමේන්තු වලට අයත් දේපල හා වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හදිසි අවස්ථා අරමුදලේ වටිනාකම රු.26,456,313 ක් වුවද එය රු.173,057,518 ක් ලෙස මධ්‍යම පළාත් සභා අවසන් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් සංචිත අරමුදල හා ක්‍රියාකාරි අතිරික්තය රු.146,601,205 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ගණුදෙණු සටහන් කිරීමේදී සිදු වූ දෝෂයක් බව දන්වා සිටිමි.	නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ රු. 104,936,000 ක වටිනාකමින් යුතු ඉඩමක් දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයිතිය පවරාගත් ප්‍රාදේශීය රෝහල් 29ක අක්කර 28 පර්චස් 02 ක් වූ ඉඩම් ද ඉඩම්වල අයිතිය පවරාගෙන නොමැති ප්‍රාදේශීය රෝහල් 88 කට අදාල ඉඩම්වල වටිනාකමද නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට සහ සම්බන්ධිත රෝහල් 62කට අදාල ඉඩම් වටිනාකම සහ මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා සම්බන්ධිත රෝහල් 216 කට අදාල ගොඩනැඟිලි හා ඉදිකිරීම් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් සහ ගොඩනැඟිලි තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත්කර තක්සේරු කටයුතු අවසන් කිරීමට සැළසුම් කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය මූලික තොරතුරු දිස්ත්‍රික්කයේ රෝහල් සහ සෞඛ්‍ය ආයතන වෙතින් රැස්කරමින් පවතින බව සඳහන් කරමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	පළාත් නිවාස දෙපාර්තමේන්තුවට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලද රු. මිලියන 11.25 ක් හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	ගිණුම්වලට අදාළ සාක්ෂි ඉදිරියේදී බැංකුව විසින් ලබාදුන් විගස විගණනය වෙත ඉදිරිපත් කිරීමට	අදාළ සනාථ කිරීම් සඳහා සාක්ෂිමය කරුණු විගණනයට

	රු.මිලියන 3.75 ක් ලෙස එකතුව රු.මිලියන 15 කින් 2005 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ආරම්භ කරන ලද "සහන් පියස" චක්‍රීය අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය රු.5,693,721 හා ණය ශේෂය වන රු.7,431,456 ක් ලෙස එකතුව රු.13,125,177 ක් අරමුදලේ ශේෂයක් පවතී. ඒ අනුව චක්‍රීය අරමුදලේ ශේෂය වාර්ෂිකව ක්‍රමික ලෙස වැඩිවිය යුතු වුවද රු.1,874,823 කින් අඩුවී තිබීමට හේතු වී ඇති කරුණු විගණනයට ඉදිරිපත් නොකරන ලදි.	කටයුතු කරන බව සහ ඉදිරි වර්ෂවලදී නියමිත කාලසීමාවන් වලදී වෙනම මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් ලෙස විගණනයට ලබාදීමට කටයුතු කරන බව දන්වමි.	ඉදිරිපත් කළ යුතුය.
(ඌ)	2014 වර්ෂයේ දී රු.8,875,040ක් වැය කර පළාත් සභා සංකීර්ණයේ සවි කරන ලද කිලෝ වොට් 45 ක ධාරිතාවයක් ඇති ජාලගත සූර්යබල විදුලි ජනක පද්ධතියේ වටිනාකම සිගාස් වැඩසටහනේ හා CSCA -6 වාර්තාවේ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	මෙම පද්ධතියට අයත් සියලුම කොටස් කවරේද යන්න පිළිබඳව කමිටුවක් මඟින් හෝ නිසි තහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරියේදී මෙම පද්ධතිය ගිණුම්ගත කිරීම සිදුකළ යුතු ආකාරය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගනිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(එ)	පිරිස් හා පුහුණු අංශයේ සිගාස් වැඩසටහන හා CSCA-6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට අනුව මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම රු.163,611,453 ක් වුවද මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ වල ශේෂය රු.40,446,000 ක් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත උපකරණවල එම ශේෂය රු.123,165,453 කින් අඩුවෙන් දක්වා තිබුණි.	පිළිගනිමි	නිවැරදි වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඒ)	පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ උප ආයතන 19 ක් පවත්වා ගෙන යනු ලබන ඉඩම් හා ගොඩනැගිලි, හඳුනාගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඔ)	පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශ ගොඩනැගිල්ලෙහි රු.4,479,000 ක් වැයකොට කි.වො. 25ක් සහ රු.1,075,657 ක් වැය කොට කි.වො. 5 ක ධාරිතාවයෙන් යුතු සූර්ය බලශක්ති පැනල පද්ධතීන් 02 ක් ස්ථාපිත කර තිබුණ ද එය වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ගත කර නොතිබුණි.	ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඕ)	''සහන් පියස'' චක්‍රීය අරමුදලෙන් ණය ලබා දී අය විය යුතු ණය ශේෂය රු.7,431,456 ක් ලෙස විගණනයට ඉදිරිපත් කල ද කේවල ණය ශේෂ ලැයිස්තුව, ණය කාල විශ්ලේෂණය, හිඟ හිටි ණය හා කපාහල ණය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	ණය ශේෂ කපා හැරීමක් සම්බන්ධයෙන් මේ වන විට වාර්තා නොවන අතර , ණය ගැති ශේෂය පිළිබද කාල විශ්ලේෂණයක් ඉදිරියේදී බැංකු පාර්ශවයෙන් අවශ්‍ය මූල්‍ය දත්ත ලබා ගෙන ලබා දීමට කටයුතු කරන බව දන්වමි	අදාළ ණය ශේෂයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ක)	පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මගී වාහන වටිනාකම රු.71,600,000ක් ලෙස දක්වා තිබුණු නමුත්, විගණනයට ඉදිරිපත් කරන ලද වාහන පිළිබඳ විස්තරය අනුව එය රු.45,658,037ක් වූයෙන් රු.25,941,963ක නොසැසඳීමක් පැවතුණි.	මගී වාහන 2 හි පෙර වටිනාකම් ඉවත් කර නව තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීම නිසා වෙනසක් වී ඇති බව දන්වා සිටිමි..	නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඛ)	සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යන පළාත් සමුපකාර සංවර්ධන අරමුදල නියාමනය කිරීම සඳහා පළාත් සභාව විසින් අනුමත කරන ලද ප්‍රඥප්තියක් හෝ රීති මාලාවක් 2025 මාර්තු 18 දින දක්වා සකස් කරගෙන නොතිබූ අතර එම අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මුදල් පොතට අනුව ශේෂය රු.20,090,181 කට සහ මෙම අරමුදල මඟින් සමුපකාර සමිතිවලට ලබා දුන් රු.40,000,000 ක ණය මුදල්වලට අදාල ගණුදෙණු හා සිද්ධීන් පිළිබඳව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මෙම අරමුදල පිළිබඳව පළාත් සභාව විසින් පිළියෙල කරනු ලබන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළ මේ දක්වා කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.	ඉදිරියේදී මධ්‍යම පළාත් සභාවේ ලේකම් හා මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් වෙත ඉදිරිපත් කර අනුමත කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	පළාත් සමුපකාර සංවර්ධන අරමුදල නියාමනය කිරීම සඳහා පළාත් සභාව විසින් අනුමත කරන ලද ප්‍රඥප්තියක් හෝ රීති මාලාවක් සකස් කර ගැනීමටත්, එම අරමුදලේ ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමටත් කටයුතු කළ යුතුය.
(ග)	පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගොඩනැඟිලි හා ඉදිකිරීම් වැය විෂයය යටතේ පාසල්වල ගොඩනැඟිලි හා ඉදිකිරීම් වෙනුවෙන් වැය කරන ලද රු.45,845,985ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (CSCA 6) පාසල් ගොඩනැගිලි (කේත අංක 6111202) අත්පත් කරගැනීම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත්, එසේ සටහන් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඝ)	ප්‍රධාන ලේකම් කාර්යාලය සතු නිල නිවාස ඇතුළු ගොඩනැඟිලි 14ක් හා එම ගොඩනැඟිලි පිහිටි භූමිවල වටිනාකම තක්සේරු කර CSCA -6 වාර්තාවේ හා සිගාස් වැඩසටහනේ දේපල පිරියත	පවරා ගෙන නොමැති වත්කම් පවරා ගැනීමෙන් පසු වත්කම් තක්සේරු කර ඉදිරියේදී සිගාස් මෘදුකාංගය වෙත ඇතුලත් කිරීමට කටයුතු කරන බව	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත

	හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	දන්වමි.	කිරීමට කටයුතු කළ යුතුය.
(ච)	මුල් ළමාවිය සංවර්ධන ඒකකය විසින් භුක්ති විදින හෙක්ටයාර් 0.1000ක් වන පල්ලේකැලේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ ඉඩම ද හෙක්ටයාර් 0.1292ක් වූ මාතලේ දිස්ත්‍රික් කාර්යාල ඉඩම ද අක්කර 01 රූඩ් 01 පර්චස් 23.8ක් වන බෝගම්බර දිස්ත්‍රික් කාර්යාලය පිහිටි දෙයියන්නේවෙල ඉඩම ද තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට කටයුතු කරමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ජ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 14(අ) ඡේදය අනුව, වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් අස්ථිත්වය වෙත ගලා ඒමේ හව්‍යතාවයක් ඇතිවිට වත්කමක් ලෙස හඳුනාගත යුතු වුවත්, කලාප අධ්‍යාපන කාර්යාල 15හි හා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල 40හි ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම්, පළාත් සභා පාසල් 1461හි ඉඩම්, ගොඩනැගිලි හා නිල නිවාසවල වටිනාකම් සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 02 හි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	අදාල තක්සේරු කටයුතු සිදුකර ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි.	දෙපාර්තමේන්තුවට අයත් දේපල හා වත්කම් හඳුනාගෙන, ඒවා තක්සේරු කර නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතුය.
(ට)	පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වාහන වටිනාකම රු. 364,037,288 ක් ලෙස දක්වා තිබුණද, විගණනයට ඉදිරිපත් කරන ලද වාහන විස්තරය අනුව එම වටිනාකම රු.319,030,000 ක් වූයෙන් රු.45,007,288 ක නොසැසඳීමක් පැවතුණි.	මෙම තත්වය ඉදිරියේදී, නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි.	නොසැසඳීම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඩ)	ආර්ථික වටිනාකම ඉහළ ප්‍රදේශයක් වන රෝහල් පටුමග නුවරඑළියෙහි පිහිටි පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් පවරා ගන්නා ලද අංක 55 දරන හෙක්ටයාර 0.0256 ක් හා අංක 57 දරන හෙක්ටයාර 0.0203 ක් වන ඉඩම් හා එහි ඉදිකල නිල නිවාස දෙක සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	එම වත්කම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ත)	පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව පරිහරණය කළද පවරා ගැනිමට අපොහොසත් වූ නිල නිවාස 13ක් හා මුළු හෙක්ටයාර් 0.4323 ක් වූ ඉඩම් සමාලෝචනය වර්ෂය අවසාන වන විටත් පවරා ගැනීම් සිදු කර තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව විසින් නිල නිවාස පවරා ගැනිමේ කටයුතු සිදුකරමින් පවතින අතර නඩු කටයුතු සිදුවන නිල නිවාස 04 ක් ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ද)	පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන තිබුණු රු. 231,130,975 ක් වූ වාහන වටිනාකම තුළ වෙනත් ආයතන විසින් භාවිතා කරනු ලබන වාහන 40 කට අදාළ රු. 203,784,975 ක වටිනාකමද ඇතුළත් කර තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ දේපළ, පිරියත හා උපකරණ අගය රු.203,784,975 ක් වැඩියෙන් දක්වා තිබුණි.	අයිතිය පවරන ලද වාහන 06ක අයිතිය පැවරීමේ කටයුතු අවසන් කර ඇති බැවින් එම වාහනවල වටිනාකම දත්ත වලින් ඉවත් කර ඇත. අනෙකුත් වාහන වල අයිතිය පැවරීමේ කටයුතු සිදු කරමින් පවතී	වාහනවල නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(න)	පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ඉඩම 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර නොතිබුණි.	ඉඩමේ අයිතිය පවරා ගත් පසු වත්කම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි.	ඉඩම්වල අයිතිය පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ප)	මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයිතිය පවරාගත් ප්‍රාදේශීය රෝහලේ 29 ක අක්කර 28 රූඩ් 0 පර්චස් 02 ක් වූ ඉඩම් සහ ඉඩම් වල අයිතිය පවරාගෙන නොමැති ප්‍රාදේශීය රෝහල් 88 කට අදාළ ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ආයතන ප්‍රධානීන් දැනුම්වත් කර ඇත.	ඉඩම්වල අයිතිය පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(බ)	මහනුවර, මාතලේ, සහ නුවරඑළිය යන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා සම්බන්ධිත රෝහල් 216 කට අදාළ ගොඩනැගිළි හා ඉදිකිරීම් වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.	අවශ්‍ය මූලික තොරතුරු දිස්ත්‍රික්කයේ රෝහල් සහ සෞඛ්‍ය ආයතන වෙතින් රැස්කරමින් පවතින බව කාරුණිකව සඳහන් කරමි.	ගොඩනැගිලි හා ඉදිකිරීමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ම)	පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ උප ආයතන පිහිටි අක්කර 19 රූඩ් 02 පර්චස් 26.5 ක ප්‍රමාණයක් වූ ඉඩම් 04 ක් විධිමත් පරිදි මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා තිබුණද එම ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් ඉඩම් තක්සේරු කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවති.	ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ය)	පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් භුක්ති විඳිනු ලබන භූමි වපසරිය හෙක්ටයාර් 1.758ක් වූ ඉඩම් 07ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි	ඉඩම් කොටස් 06 ක් මේ වනවිට මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම්වලට ඇතුළත් කර ඇති අතර, ඉතිරි ඉඩම් කොටස පිළිබඳව පවතින ගැටළුකාරී තත්වය සම්බන්ධයෙන් ඉදිරි පියවර ගෙන වාර්තා කිරීමට කටයුතු කරන සඳහන් කර සිටිමි.	වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ර)	පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුව යටතේ මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල පවතින පේෂකර්ම මධ්‍යස්ථාන පිහිටි ඉඩම් කැබලි	පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි.	ඉඩම්වල අයිතිය පවරා ගෙන වටිනාකම

	163 න් ඉඩම් කැබලි 129 ක නෛතික අයිතිය දෙපාර්මේන්තුව වෙත පවරා ගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.		තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ල)	පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි ප්‍රමාණය 175 ක් වන අතර ඉන් ගොඩනැගිලි 43 ක් රු.178,900,600 කට අත්පත් කරගෙන ගිණුම්ගත කර තිබුණද ඉතිරි ගොඩනැගිලි 132 ක තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.	පවරා නොගත් ඉඩම්වල අයිතිය පවරා ගැනීමෙන් පසු තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.	ඉඩම්වල අයිතිය පවරා ගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ව)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරා ගෙන ඇති එකතුව හෙක්ටයාර 10.9725 ක ඉඩම් හා පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 2 ක්, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 3 ක්, දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන 3ක්, පටක රෝපණාගාරය, නිල නිවාස 9 ක් හා ගොඩනැගිල්ලක් ද ඇතුළුව එකතුව ගොඩනැගිලි 20 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ගොඩනැගිලි වල තක්සේරු වටනාකම් ලද විගස ගිණුම් ගත කිරිමට කටයුතු කරන බව දන්වමි.	වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ශ)	පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගන්නා පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල 02 ක්, පශු රෝහල් 02 ක, පශු වෛද්‍ය කාර්යාල 15 ක ඉඩම් වල වටිනාකම හා පශු වෛද්‍ය කාර්යාල 04 ක ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරාගෙන වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණ	ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරිමට හා අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි.	අයිතිය පවරා ගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය.
(ස)	පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවට අයත් අංක 230/3 එස්.ඩබ්.ආර්.ඩී.බංඩාරනායක මාවත, මහනුවර ලිපිනයේ පිහිටි හෙක්ටයාර් 0.0991 ක ඉඩම හා එම ඉඩමේ පිහිටි ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර දේපල පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	එම වත්කම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත.	වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 540 - මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 10/2007 (1) හා 2009 මාර්තු 05 දිනැති නිවාස පහසුකම් ලබා දීමේ චක්‍රලේඛය, 2023 සැප්තැම්බර් 18 දිනැති යොමු අංක CPC/LC/LD/09/32/85 දරණ ලිපිය මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකුට සමාන මාසික වැටුප් සහ දීමනා ගෙවනු ලැබීමට ඇති හිමිකම සහ එක් නිල නිවසක් සඳහා පවතින හිමිකමට අනුව පළාත් ආණ්ඩුකාරවරයා සඳහා මාළිගා චතුරශ්‍රය,රජ වීදිය ,මහනුවර යන ලිපිනයෙහි සියළුම පහසුකම් සහිතව නිල නිවසක් සපයා දී තිබියදී ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට පවරා දී තිබුණු ගල්පාලම සංචාරක බංගලාව මේ දක්වා සංචාරක බංගලාවක් ලෙස භාවිතා කර තිබූ වරින් වර පත්වූ ආණ්ඩුකාරවරු විසින් අමතර නිල නිවාසයක් ලෙස භාවිතා කර තිබූ අතර 2023 වර්ෂයේදී හා 2024 ඔක්තෝබර් 31 දිනට විදුලි බිල්පත්, දුරකථන බිල්පත්, රූපවාහිනී සබඳතා වියදම් හා ඉන්වෙන්ට්‍රි අයිතම ලබා දීම වෙනුවෙන් රු. 491,503 ක මුදලක් වැය කර තිබුණි. සංචාරක බංගලාවේ බංගලා භාරකරු වෙනුවෙන් වැටුප් හා අතිකාල වශයෙන් 2023 වර්ෂයේදී රු.495,480 ක් ද සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 31 දිනට රු.421,100 ක් ද ගෙවා තිබුණි.	මින් ඉදිරියට මෙම නිලධාරියා වෙත අතිකාල දීමනා ලබා දීම, විශේෂ අමුත්තන් ගල්පාලම බංගලාව පරිහරණයට පැමිණි දින වල සත්‍ය වශයෙන් රාජකාරී කටයුතු කල කාලසීමාව සඳහා පමණක් ලබා දීමට කටයුතු කරන බව දන්වමි.	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.
(ආ)	2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරණ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව පළාත් ආණ්ඩුකාරවරයා වෙනුවෙන් වෙන් කරනු ලැබූ නිල වාහන 02 කට අතිරේකව, චක්‍රලේඛයේ නිශ්චිතව ප්‍රතිපාදන සලසා නොතිබූ ආරක්ෂක රථය වෙනුවෙන් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මඟින් ඉන්ධන සපයා දී ඉන්ධන වියදම ඉතිරි කර ගත හැකිව තිබූ නමුත් මසකට ඉන්ධන ලීටර් 495 බැගින් 2023 වර්ෂයේදී	චක්‍රලේඛයේ උපදෙස් අනුව මධ්‍යම පළාත් හිටපු ගරු ආණ්ඩුකාරතුමන් වෙත 2023 සහ 2024 වර්ෂ වෙනුවෙන් එතුමන් විසින් භාවිතා කරන ලද ආරක්ෂක රථය වෙනුවෙන් ඉන්ධන දීමනාව ලබා දී ඇති බව දන්වමි.	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය

රු.2,057,220 ක් හා 2024 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු.1,645,310ක් වශයෙන් එකතුව රු.3,702,530 ක ඉන්ධන දීමනාවක් මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාට හිමි ඉන්ධන දීමනාවට අමතරව ඔහුගේ වැටුප සමග ගෙවා තිබුණි.

1.5.2 ශීර්ෂය 542 - මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභා සංකීර්ණයේ සූර්යබල විදුලි ජනක පද්ධතියක් සවිකර අදාළ සමාගම විසින් ගිවිසුම් ප්‍රකාරව එකී පද්ධතිය නඩත්තු නොකිරිම හා ගිවිසුම උල්ලංඝනය කිරිම නිසා අපේක්ෂිත විදුලි ජනන ඒකක ගණන අඩු වීම මත විදුලි බිල අඩුකර ගත නොහැකි වීමෙන් 2023 පෙබරවාරි.28 දිනට රු. 6,292,843 ක පාඩුවක් සිදු වී තිබුණු අතර එදින සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා සිදු වූ පාඩුව ගණනය කිරිමටද කටයුතු කර නොතිබුණි.	අදාළ පාඩුව අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී ලැබෙන නීති උපදෙස් වලට අනුව කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි	සිදු වී ඇති පාඩුව අය කර ගැනීමටත් වත්කම් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය

1.5.3 ශීර්ෂය 545 - මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය (මුදල්)

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 128(2) (ඉ) අනුව කටයුතු කර 2024 දෙසැම්බර් 31 දිනට ආදායම් විෂයයන් 04 ක පැවති රු.211,380,607 හිඟ ආදායම් අය කර නොතිබූ අතර රජයේ ඉඩම් පනත යටතේ පැවරුම් ගාස්තු හා බදුකුලී (ආදායම් ශීර්ෂ 2002-01-05) හිඟ ආදායම රු.36,372,513 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අයකර නොගෙන පැවතුණි.	හිඟ බදු අය කර ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වමි.	හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.4 ශීර්ෂය 546 - මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 104(I) (අ) හා ප්‍රඥප්තියේ 104 සංශෝධනයේ 1992 වගන්තිය 04 ආයතනයේ නිළධාරින්ට ගෙවන දිරි දිමනා සම්බන්ධයෙන් විගණිත දින වූ 2024	ඉදිරියට දිරි දිමනා අරමුදල් ගිණුමක් පිහිටුවා ගිණුම් විගණකාධිපතිවරයාට විගණනය සඳහා ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව දන්වමි.	ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	දෙසැම්බර් 13 වන විටත් අරමුදලක් පිහිටුවා එම අරමුදලේ ගිණුම් විගණනය කිරීමට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.		
(ආ)	2016 අගෝස්තු 30 දිනැති මධ්‍යම පළාත් ගිණුම් කාරක සභා නියෝගය පරිදි හිග පිරිවැටුම් බදු ශේෂය වූ රු.17,279,654 ක් කඩිනමින් අය කරගෙන වාර්තාවක් ගිණුම් කාරක සභාවට හා විගණනයට ඉදිරිපත් කරන ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට නියෝග කර, එදින සිට වර්ෂ 08 කට ආසන්න කාලයක් ගතව තිබුණද 1990 අංක 17 දරණ මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තිය හා 1992 අංක 01 දරණ මධ්‍යම පළාතේ සංශෝධන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව 2024 හිග පිරිවැටුම් බදු ශේෂය අය කරගෙන නොතිබුණු අතර මුදල් රෙගුලාසි 128 (2) ප්‍රකාරව රාජ්‍ය ආදායම එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන්දීමේ නිලධාරීන් රජයට ලැබිය යුතු හිග ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධි විධාන යෙදිය යුතු, ලිපිගොනු 59 කට අදාළ රු. 7,469,542 ක හිග පිරිවැටුම් බදු ආදායමින් කපාහැරීම සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ නිර්දේශයන් සහිතව ප්‍රධාන ලේකම්වරයා වෙත යවා තිබුණි .	ලිපිගොනු 59 ක් කපා හැරීමේ ලේඛණයට ඇතුලත් කර ඇත්තේ එම ව්‍යාපාර බංකොලොත් වීම නිසා ව්‍යාපාර වසා දමා තිබීම, ව්‍යාපාර හිමිකරුවන් පදිංචිය හැරගොස් සිටීම, ඇතැම් ව්‍යාපාර හිමිකරුවන් මියගොස් සිටීම, හෝ අයහපත සෞඛ්‍ය තත්වයෙන් පසුවීම හා වෙනත් කිසිදු ආදායම් මාර්ගයක් නොමැතිවීම වැනි හේතු මතය. අයකරගැනීමේ ක්‍රියාවලිය තුල පවතින ගොනු සඳහා විවිධාකාරයෙන් තොරතුරු ලබාගෙන අදාල පුද්ගලයන් සාකච්ඡා සඳහා කැඳවා අයකරගැනීමට කටයුතු කරමින් පවති.	පළාත් ගිණුම් කාරක සභා නියෝගය අනුව කටයුතු කළ යුතුය.

1.5.5 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම.	නිර්දේශය
(අ)	2016 සිට 2019 දක්වා වර්ෂවලට අදාලව වෙන් කරන ලද රු.734,803ක් වූ විගණන ගාස්තු වසර 6 - 8 කට අධික කාලයක් ගත වී තිබුණද ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	හිග ශේෂ පිළිබඳ විමසා බලා ඉදිරියේ දි තීරණයක් ගන්නා බව දන්වමි	සියලුම හිග විගණන ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතුය.
(ආ)	මහනුවර සංචාරක තොරතුරු මධ්‍යස්ථානය වෙනුවෙන් 2023 හා 2024 වර්ෂ වල මාස 17ක් සඳහා මහනුවර මහනගර සභාවට ගෙවිය යුතු බදු කුලිය රු.1,697,025ක් ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2025 ගිණුම් සකස් කිරීමේ දි නිවැරදි කරන බව දන්වමි	සියලුම ගෙවිය යුතු බදු කුලී ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ග්‍රීන් පාක් හෝල්ඩිංග්ස් ආයතනයෙන් අය කරගත යුතු හිඟ බදු මුදල වන	ඉදිරි වර්ෂ වල ගිණුම් සකස් කිරීමේ දි සටහන් කරන බව දන්වමි.	මූල්‍ය ප්‍රකාශන වල සියළු කරුණු

	රු.3,167,023ක මුදල අය කර ගැනීමට මහනුවර දිසා අධිකරණයේ ගොනු කර ඇති නඩුව සහ සේවයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් පවිත්‍රතා සේවයේ කම්කරුවෙකු විසින් කම්කරු විනිශ්චය සභාවේ ගොනුකර ඇති නඩුව පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි.		හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය විසින් පරිහරණය කරන 2023 දෙසැම්බර් 31 දිනට තක්සේරු අගය රු.24,280,000ක් වූ වාහන 7ක අයිතිය ආයතනය වෙත පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	වාහන 06 ක් පවරා ගෙන නොමැති අතර වාහන 01 පමණක් පවරා ගෙන ඇති බව දන්වමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වත්කම් පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.5.6 ශීර්ෂය - 550 - මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ව්‍යාජ සහතික ඉදිරිපත් කිරීම හේතුවෙන් පාසැල් කාර්ය සහායක සහ මුරකරු ලෙස සේවය කරන ලද සේවකයන් 19 දෙනෙකුගේ සේවය අවසන් කර තිබුණි. කෙසේ වුවද, 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 59 වගන්තිය ප්‍රකාරව, සාවද්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය වී ඇති අවස්ථාවක පත්වීම අවලංගු කර ඒ වනවිටත් ඔවුන්ට වැටුප් හා දීමනා ලෙස රජය හෝ පළාත් සභාව විසින් ගෙවා ඇති සියලු මුදල් ආපසු අයකර ගැනීමට ක්‍රියාකලයුතු බව දක්වා තිබුණද, මෙම සේවකයන් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	2023.01.01 දිනට පෙර පත්වීම් අවසන් කරන ලද සේවක මහත්ම මහත්මීන් 17 දෙනා වෙත වැටුප් ගෙවා ඇත්තේ ඔවුන්ගෙන් ලබා ගත් සේවය සඳහා වන අතර ඒ සම්බන්ධයෙන් රජයට කිසිඳු අලාභයක් හෝ පාඩුවක් සිදුවී නොමැති නමුත් අංක 17 හා 18 යටතේ සිටින සේවක මහතුන් දෙදෙනාගේ පත්වීම් 2023.01.01 දිනට පසු අවසන් කර ඇති බැවින් ඔවුන් විසින් රජයට ගෙවිය යුතු මුදල් නැවත අය කර ගැනීම සම්බන්ධ තොරතුරු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් මා වෙත ලද විගස ඔබ වෙත යොමු කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි	ව්‍යාජ සහතික මත ලබාගත් පත්වීම් ද නීත්‍යානුකූල නොවන බැවින් අනීතිකව කරනු ලැබූ ගෙවීම් ආපසු අයකර ගත යුතුය.
(ආ)	ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, විදුහල්පති සේවයේ හා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් පවතින විනය කටයුතු වසර 01 සිට 05 දක්වා කාලයක් ගත වී තිබුණද පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණු අවස්ථා 07ක් නිරීක්ෂණය විය.	පරීක්ෂණ කටයුතු එක් එක් අදියරේ සිදුවෙමින් පවතින බව පෙන්වා දෙමි.	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කල යුතු ය.

(ඇ)	මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව, නැතිවීම්/හානිවීම් සම්බන්ධයෙන් පරීක්ෂණයෙන් පසු අලාභ හානිය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවද, අවස්ථා 05කට අදාළව සිදුකළ යුතු මු.රෙ.104(4) පරීක්ෂණ කටයුතු සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කර තිබුණද, වර්ෂ 01 සිට වර්ෂ 06ක් දක්වා එම පරීක්ෂණ කටයුතු ප්‍රමාද වී තිබුණි.	පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී.	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය සතු වටිනාකම රු.14,478,826ක් වූ වාහන 02ක් ජනාධිපති ලේකම් කාර්යාලයේ පරිහරණයට ලබාදී තිබුණද, එම වත්කම් නිවැරදිව පවරා දීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි කටයුතු සිදුකිරිම සඳහා ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති බව දන්වමි.	වත්කම් නිවැරදිව පවරාදීමට කටයුතු කළ යුතුය.
(ඉ)	විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, මධ්‍යම පළාත තුළ වැඩබලන විදුහල්පතිවරුන් 420 දෙනෙකු සේවය කරන බව නිරීක්ෂණය වූ අතර විදුහල්පති ශ්‍රේණිධාරීන් 454 දෙනෙකු පාසල්වල අතිරික්ත ලෙස සේවයේ යොදවා තිබුණි. ඒ අනුව, විදුහල්පති ශ්‍රේණිධාරීන් නිසි පරිදි ස්ථානගත කර පළාතේ සියලු කලාපවල මෙම තනතුරුවල තුලනයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි.	විදුහලක විදුහල්පති වරයෙකු පුරප්පාඩු වන අවස්ථාවලදී එම තනතුරේ වැඩ බැලීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් නිලධාරීන් පත් කිරීම නවතා ඇති අතර ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරීන් පත් කරනු ලබයි.එමෙන්ම දැනට වැඩ බලන විදුහල්පති වරුන් සිටින පාසල් සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ක්‍රමවේදයක් අනුව ස්ථාන ගත කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.	විදුහල්පති ශ්‍රේණිධාරින් නිසි පරිදි ස්ථාන ගත කිරීමට කටයුතු කළ යුතුය. .
(ඊ)	මධ්‍යම පළාත් කාර්ය මණ්ඩලය තුල විදුහල්පති පුරප්පාඩු 504 ක්, නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු 137 ක් හා අතිරික්තතා 10 ක් සහ සහකාර විදුහල්පති පුරප්පාඩු 11 ක් හා අතිරික්තතා 444 ක් පැවතුණි. ඒ අතුරින් මහනුවර කලාපය තුළ නියෝජ්‍ය විදුහල්පති 09 දෙනෙකු සහ සහකාර විදුහල්පතිවරුන් 125 දෙනෙකු අතිරික්තව සේවය කරන බව නිරීක්ෂණය විය. ගලේවෙල සහ විල්ගමුව යන කලාපවල පමණක් සහකාර විදුහල්පති පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 07 ක් සහ 04 ක් විය. විල්ගමුව කලාපයේ විදුහල්පති ශ්‍රේණිධාරි පුරප්පාඩු 40 ක් පැවතියද, නව විදුහල්පති ශ්‍රේණිධාරීන් ස්ථානගත කිරීමේදී මෙම කලාපය සඳහා කිසිදු නිලධාරියෙකු ස්ථානගත කිරීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි.	වාර්ෂික ස්ථානමාරු මඟින් විදුහල්පති ශ්‍රේණිධාරීන් තුලනය කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි.	අනුමත කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාමටත් අදාළ තනතුරු සඳහා ශ්‍රේණිධාරින් නිසි පරිදි ස්ථාන ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.5.7 ශීර්ෂය 551 - මධ්‍යම පළාත් පාලන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණ කමිටු පත් කළ දින සිට මාස තුනක් ඇතුළත පරීක්ෂණ කමිටු වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව 2024 අගෝස්තු 31 දිනට පරීක්ෂණ කමිටු පත්කර මාස 03 සිට අවු.02 දක්වා කාලයක් ඉක්මවා ගොස් තිබුණ නමුත් කමිටු වාර්තාව ඉදිරිපත් නොකල අවස්ථා 33 ක් විය.	අදාල වාර්තා කඩිනමින් ලබා ගැනීම සඳහා ඔවුන් වෙත ඉලක්ක ගත කාල රාමුවක් ලබා දී ඇති බවත්, ඒ් අනුව අඛණ්ඩව ඊට අදාල පසුවිපරම් කටයුතු සිදු කරන බව සඳහන් කරමි.	මුදල් රෙගුලාසි අනුව සහ කාල ප්‍රමාදයකින් තොරව පරීක්ෂණ අවසන් ක ළ යුතුය.
(ආ)	2014 මැයි 30 දිනැති අංක 14/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 06,07 හා 08 ඡේද ප්‍රකාරව මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක වලට අදාල පළාත් පාළන ආයතන වල සිදු වී ඇති අක්‍රමිකතා සඳහා මූලික විමර්ශණ පැවැත්වීමට අදාල කමිටු පත් කර අවුරුදු 1 – 7 අතර දක්වා කාලයක් ගත කර තිබුණ ද සිද්ධි 2 කට අදාළව මූලික විමර්ශන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	මූලික විමර්ශන වාර්තා 2025 මැයි 31 ට ප්‍ර ථම ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස් වරුන් දැනුවත් කර ඇති බව දන්වමි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	මධ්‍යම පළාතේ, පළාත් පාලන ආයතනවල අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපති විසින් 2013 සිට 2022 කාල පරාසයක් තුළ නිකුත් කර තිබූ අධිභාර සහතික 14 කට අදාලව රු.9,523,301 ක අධිභාර අයකර ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් කටයුතු කර නොතිබුණි.	තවදුරටත් පළාත් පාලන ආයතන 07 න් රු.9,288,299.78ක මුදලක් අයකිරීමට ඇති බවත් කාරුණිකව සඳහන් කරමි.	අධිභාර කර ඇති මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.8 ශීර්ෂය 552 - මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප කාර්යාල සහ පළාත් පාසල්වල තනතුරු 23ක පුරප්පාඩු 7,781 ක් සහ තනතුරු 13ක අතිරික්තතා 3,509ක් පැවතියද, පුරප්පාඩු පිරවීමට හෝ අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු පවතින ස්ථාන වෙත ස්ථානගත කිරීමට පරිපාලනය විසින් කටයුතු කර නොතිබුණි.	මාසික කාර්යය මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීමේදී මෙම තනතුරු වල පුරප්පාඩු හා අතිරික්තතා පිළිබඳව තොරතුරු ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු ඇත.	පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත නිලධාරීන් පුරප්පාඩු පවතින ස්ථාන වෙත ස්ථානගත කිරීමට කයුතු කළ යුතුය.

(ආ)	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති පාඩු හා අත්හැරීම් පිළිබද ප්‍රකාශය (Note –i) අනුව, සමාලෝචිත වර්ෂය අවසන් දිනට එකතුව රු 23,966,124 ක වටිනාකමක් ඇති සිද්ධීන් 104 ක් තවදුරටත් අයකර ගැනීම හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.	මෙම සිද්ධීන් සඳහා පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර, අධිභාර අය කර ගැනිම සඳහා කළාප කාර්යාලවලට දන්වා යවා ඇත. වර්තමානය වන විට ප්‍රදාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නැවතත් පරීක්ෂණ පැවැත්විම සඳහා පරීක්ෂණ මණ්ඩලය පත් කර ඇති අතර, එම පරීක්ෂණ වර්තමානය වන විටත්, සිදු කරමින් පවතින බව දන්වමි.	විධිමත් ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කලාප අධ්‍යාපන කාර්යාල 10කට ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු පැමිණිලි සහ පෙත්සම් 751ක් සම්බන්ධයෙන් විමර්ශන මණ්ඩල පත්කර ඇතත් පරීක්ෂණ කටයුතු නිමකර වාර්තා ලබාදී නොතිබුණි.	මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පවතින මානව සම්පත ප්‍රමාණවත් නොවීමත් රාජකාරීමය කාර්ය බහුලත්වය හේතුවෙන් එකවර නිලධාරින් 3දෙනෙකු සහභාගී වීමට ඇති අපහසුතාවයත් නිසා මෙම විමර්ශන වාර්තා ලබාදීම ප්‍රමාද වී ඇති බව කාරුණිකව දන්වමි.	පැමිණිලි හා පෙත්සම් සම්බන්ධ පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කරඇති, වෙනත් සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් රු. 78,769,816 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවති අතර ඒ අතුරින් වර්ෂ 05 ඉක්මවා ඇති ණය ශේෂ වටිනාකම රු.57,961,525ක් විය.	පළාත් කාර්යාලය හා කලාප කාර්යාල 15 සඳහා පරීක්ෂණ කමිටු පත්කර ලබාගත් නිර්දේශ හා අමාත්‍යාංශ අනුමැතිය අනුව නිළධාරින් 261 දෙනෙකුගේ රු.8,006,847.75 ක් වටිනා ණය ශේෂයන් කපා හැරීමට කටයුතු කරන ලද අතර ස්ථාන මාරු වී පැමිණ ඇති නිළධාරින්ගේ ණය ශේෂ නිරවුල් කිරීමේදී ප්‍රමාණවත් තහවුරු කිරීම් නොමැති නිසා මෙම ණය ශේෂයන් නිරවුල් කිරීමේදි ගැටළු පැන නැගි ඇත.	අත්තිකාරම් ගිණුම්වල පවතින ලැබිය යුතු ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වනවිටස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්ගේ නිරවුල් කළයුතු ණය ශේෂයන්ගේ එකතුව රු.12,693,632 ක් වූ අතර ඒ අතුරින් වර්ෂ 05 ක් ඉක්මවා ඇති ණය ශේෂය රු.10,734,533ක් විය.	මෙම සියළුම ණය ශේෂයන් පරීක්ෂණ මණ්ඩල මගින්ද පරීක්ෂාවට ලක්කරන ලද ණය ශේෂයන් වන අතර නිරවුල් කිරීමට ප්‍රමාණවත් තහවුරු කිරීම් නොමැති නිසා ගැලපීම් කිරීමට නිර්දේශ නොලද ණය ශේෂ වේ.	අත්තිකාරම් ගිණුම්වල පවතින ගෙවිය යුතු ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2023 දෙසැම්බර් 29 දිනැති අංක 54/2023 දරන චක්‍රලේඛයේ 14:1:8 ඡේදය අනුව පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් වවුචර් සඳහා ගෙවීම් කිරීමේදී විදුහල්පති ගෙවීම් අනුමත කලයුතු බවත්, නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති විසින් වවුචර් සහතික කළයුතු වුවත් මහ/තෙල්/රඹුක්වැල්ල කණිෂ්ඨ විද්‍යාලයේ, මප/දෙනු/හැරමිටිගල ශ්‍රී ධීරානන්ද මහා විද්‍යාලයේ සහ මප/ගම්/ජිනරාජ පිරිමි විද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කරන ලද රු.964,557 ක් වූ වවුචර් 32ක් ගෙවීම්	වවුචර් වල පැවති අනුමත කිරිම හා සහතික කිරීම් අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු සිදු කර ඇත.	චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

	අනුමත කිරීම හෝ සහතික කිරීම සිදුකර නොතිබුණි.		
(උ)	2023 දෙසැම්බර් 29 දිනැති අංක 54/2023 දරන චක්‍රලේඛයේ 14:1:3 සහ 14.1.5 ඡේද මප/දෙනු/හැරමිටිගල ශ්‍රී ධීරානන්ද මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් අවස්ථා 13කදී ගෙවන ලද රු.1,138,530 ක ගෙවීම් සම්බන්ධ බිල්පත් හෝ ලියවිලි ඉදිරිපත් කර නොමැතිව ගෙවීම් කර තිබීම සහ අවස්ථා 07 කදී මිලදී ගන්නා ලද රු.477,000 ක් වටිනා භාණ්ඩ සඳහා ගෙවීම් සනාථ කිරීමට අදාළ සහතික අමුණා නොතිබුණි.	මු.රෙ 104(03) ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇත. එම පරීක්ෂණ වාර්තාව ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඔබ වෙත වාර්තා කරන බව දන්වා සිටිමි.	චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.
(ඌ)	මප/මහ/ පේරාදෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනේ විෂයයක් වන ග්‍රැෆික් නිර්මාණකරණය (සිංහල මාධ්‍යය) සඳහා ශ්‍රී.ලං.ගු.සේ. 3 පන්තියේ 1(අ) පත්වීමක් ලැබූ ගුරුභවතෙකු 2018 ජූලි 23 වැඩභාරගෙන තිබුණි. 2021 වර්ෂයේ සිට මෙම විෂයය සඳහා සිසුන් ඉල්ලීම් කර නොමැති බැවින් මෙම ගුරුභවතා 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කිසිදු සේවයක් නොකර වැටුප් ලෙස රු.1,547,142 ක් ලබාගෙන තිබුණි.	මේ පිළිබඳව විමර්ශනයක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදුකර ඇත.	ගුරුවරුන් විෂයයට අදාළ ඉගැන්වීමේ කටයුතු සඳහා යෙදවිය යුතුය.
(එ)	හඟුරන්කෙත කළාප අධ්‍යාපන කාර්යාලයේ වැටුප් සකස් කිරීමේ දී සිදු කර තිබුණු වැටුප් අක්‍රමිකතාවයට අදාලව රු.767,213ක මුදලක් තවදුරටත් අය වීමට පැවති අතර, එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මෙම මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් විමර්ශන මණ්ඩලයේ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.	අයවීමට ඇති රු. 767,215.75 ක මුදල ගෙවිය යුතු ඩී.එම්.ඒ.දසනායක මහතා 2024.08.15 මියගොස් ඇති බැවින්, එම අධිභාර මුදල අයකර ගැනීමට නිර්දේශ ලබා ගැනීම සඳහා ඔහුගේ වැන්දඹු විශ්‍රාම වැටුප සම්බන්ධ තොරතුරු ප්‍රධාන අමාත්‍යාංශයට යොමු කර ඇත.	අය විය යුතු මුදල් අය කර ගැනීමටත් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ඒ)	පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාලව හඳුනාගත් අලාභ හානි සම්බන්ධව සිදුකල මු.රෙ.104(4) පරීක්ෂණවල නිර්දේශ අනුව සහ මුදල් රෙගුලාසි 119 (පළාත් මූල්‍ය රීති 68) අනුව අධිභාර කරන ලද අලාභ හානි 12ක් සම්බන්ධව රු.2,148,225 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	තවදුරටත් අයකිරීමට පැවති රු. 2,148,225 ක අධිභාර මුදලින් මේ වන විට රු. 149,862.80 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, තව දුරටත් අයකර ගැනීමට ඇති අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වමි.	අධිභාර කරන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඔ)	විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති කාර්යසාධන වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යම පළාතෙන් පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනීසිටි සිසුන් 42,970 දෙනෙකු අතුරින් සිසුන් 5,469	දිවයිනේ පළාත් අතුරින් මාධ්‍ය අනුව අදායම් තත්ත්වය අනුව,පාසල් පිහිටීම අනුව,පහසුකම් අනුව වැඩිම විෂමතාවයක් පෙන්නුම් කරන මධ්‍යම පළාතේ ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය	වාර්ෂිකව ස්ථාපිත කරගන්නා ඉලක්ක ළඟාකර ගැනීමට සහ කාර්යසාධන මට්ටම ඉහළ නංවා ගැනීමට

	දෙනෙකු එනම් සියයට 12.75ක් කඩඉම් ලකුණ ඉක්මවා තිබුණු අතර එම ප්‍රතිශතය දිවයිනේ සමස්ත ප්‍රතිශතය වූ සියයට 16.05ට වඩා පහළ මට්ටමක පැවතුණි. දිවයිනේ පළාත් 09 සමඟ සැසඳීමේදී මධ්‍යම පළාත 09 ස්ථානයේ පවතින අතර දිවයිනේ දිස්ත්‍රික්ක 25 සමඟ සැසඳීමේදී මාතලේ, නුවරඑළිය සහ මහනුවර යන දිස්ත්‍රික්ක පිළිවෙලින් 17, 21 සහ 22 යන ස්ථාන හිමිකරගෙන තිබුණි. කඩඉම් ලකුණ ඉක්මවූ සිසුන්ගේ ප්‍රතිශතය දිවයිනේ කලාප 100 සමඟ සැසඳීමේදී මධ්‍යම පළාතේ කලාප 15 අතුරින් කලාප 12ක්ම 50 වැනි ස්ථානයෙන් පහළ ස්ථානයක පැවති අතර ඒ අතුරින් නුවරඑළිය කලාපය 96 වැනි ස්ථානයේ පැවතුණි. ඒ අනුව, පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ සමස්ත දිවයිනේ ප්‍රතිඵල සමඟ සැසඳීමේදී මධ්‍යම පළාත ඉතා පහළ මට්ටමක පැවතුණි.	සඳහා ප්‍රාථමික පුහුණු ගුරු හිඟය දැඩි ලෙස බලපා ඇත. එමෙන්ම මධ්‍යම පළාතේ ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරුන්ගේ හා සම්පත්දායකයින්ගේ ද විශාල හිඟයක් පවතී. මෙම තත්ත්වයන් යටතේ ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදෙන ගුරුභවතුන්ට අවශ්‍ය මඟපෙන්වීම සඳහා ද අවශ්‍ය මානව සම්පත නොමැතිවීම ගැටලුවකි.	කටයුතු කළ යුතුය.
(ඕ)	විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති කාර්යසාධන වාර්තාව අනුව, 2024 මැයි මාසයේ පැවති 2023 වර්ෂයේ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සඳහා මධ්‍යම පළාතෙන් සිසුන් 41,737 දෙනෙකු පෙනීසිට ඇති අතර සිසුන් 31,380 දෙනෙකු එනම් සියයට 75.19ක් අ.පො.ස. උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් ලබා තිබුණි. ගණිතය විෂයය ඇතුළුව සම්මාන 03ක් ලබාගනිමින් උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලබා තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාව 27,372ක් එනම් සියයට 65.58ක් වූ අතර සිසුන් 766 දෙනෙකු සියළු විෂයයන් අසමත්ව තිබුණි. උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් ලබා තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය අනුව, දිවයිනේ පළාත් 09 අතුරින් මධ්‍යම පළාතට 05 වන ස්ථානය හිමිවී තිබුණි. උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් ලබා තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාවේ දිවයිනේ සමස්ත ප්‍රතිශතය සියයට 75.72ක් වූ අතර මධ්‍යම පළාතේ මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක එම ප්‍රතිශතයට ළඟාවී නොතිබුණි. ගණිතය විෂයය ඇතුළුව සම්මාන 03ක් සහිතව විභාගය සමත් ප්‍රතිශතය සැසඳීමේදී ගම්පොල, ගලේවෙල සහ නුවරඑළිය යන කලාපවල එම ප්‍රතිශතය සියයට 60කට වඩා අඩු මට්ටමක පැවති අතර දිවයිනේ කලාප 100 සමඟ සැසඳීමේදී මධ්‍යම පළාතේ කලාප 15 අතුරින් කලාප 08ක්ම 50 වන ස්ථානයෙන් පහළ ස්ථානයක පැවතුණි. ඒ අතුරින් ගම්පොල කලාපය 88 වැනි ස්ථානය දක්වා පහත වැටී තිබුණි.	අපගේ අවධානය සෑම වර්ෂයකම ප්‍රතිඵල පෙර වර්ෂයට වඩා වර්ධනය කර ගැනීමටය. ඒ අනුව පාසල් වලට අමතරව කලාප වල ගැටළු හඳුනාගෙන පළාත් මට්ටමින් වැඩසටහන් සංවිධානය කර ඉදිරි වර්ෂ වලදී සුවිශේෂ ප්‍රතිපාදන වර්ධනයට ක්‍රියාත්මක කරමින් පවතී.	වාර්ෂිකව ස්ථාපිත කරගන්නා ඉලක්ක ළඟාකර ගැනීමට සහ කාර්යසාධන මට්ටම ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.

(ක)	විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති කාර්යසාධන වාර්තාව අනුව, 2023 වර්ෂයට අදාළව 2024 වර්ෂයේ පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයට මධ්‍යම පළාතෙන් සිසුන් 30,366 දෙනෙකු පෙනීසිට සිසුන් 19,255 දෙනෙකු එනම් සියයට 63.41ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණු අතර එය දිවයිනේ සමස්ත ප්‍රතිශතය වූ සියයට 66.07ට වඩා පහළ මට්ටමක පැවතුණි. සියළු විෂය ධාරාවන් යටතේ සියළු විෂයයන් සඳහා විශිෂ්ඨ සාමාර්ථ ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 904ක් වූ අතර ඊට සාපේක්ෂව සියළු විෂයයන් අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව 2,915ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි. ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, වාණිජ සහ කලා යන විෂය ධාරාවන් යටතේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය අනුව, දිවයිනේ පළාත් 09 අතුරින් මධ්‍යම පළාතට පිළිවෙලින් 03,05,07,08,08 හා 08 යන ස්ථාන හිමිව තිබුණු අතර දිවයිනේ අනෙකුත් පළාත් සමඟ සැසඳීමේදී ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, වාණිජ සහ කලා යන විෂය ධාරාවන්ගේ ප්‍රතිඵල අනුව මධ්‍යම පළාත පහළ මට්ටමක පැවතුණි. තවද, විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය අනුව දිවයිනේ දිස්ත්‍රික්ක 25 අතුරින් මධ්‍යම පළාතේ නුවරඑළිය, මාතලේ සහ මහනුවර යන දිස්ත්‍රික්ක පිළිවෙලින් 18,20 සහ 22 ස්ථාන හිමිකරගෙන තිබුණි.	ප්‍රතිඵල වර්ධනය සඳහා සීමාකාරී ලෙස බලපාන සාධක ද පළාතට සුවිශේෂිව පවතී.ඒවා අතර සමහර විෂයයන් සහ මාධ්‍ය අනුව ගුරු භවතුන් නොසිටීම, ආර්ථික කටයුතු සඳහා සිසු සහභාගීත්වය ලබා ගැනීමට දෙමාපියන් පෙළඹීම සහ සිසුන්ගේ පාසල් නොපැමිණීම යනාදිය දැක්විය හැක.මෙම කරුණු සියල්ල සැලකිල්ලට ගෙන ගුණාත්මක ප්‍රතිඵල සංවර්ධනයට මධ්‍යම පළාත් පියවර ගනිමින් සිටී.	වාර්ෂිකව ස්ථාපිත කරගන්නා ඉලක්ක ළඟාකර ගැනීමට සහ කාර්යසාධන මට්ටම ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.9 ශීර්ෂය 553 - මධ්‍යම පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කැටවල ග්‍රාම නිලධාරි වසමේ පදිංචි අදාල භුක්ති විඳින පාර්ශවය වෙත 2003 ජූලි 23 දින සිට ඉදිරි වර්ෂ 30 ක කාලසීමාවක් සඳහා පර්චස් 20 ක ඉඩමක් වාණිජ කටයුත්තක් සඳහා බදු දී තිබුණ ද 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු බදු මුදල හා වාරමුදල් එකතුව රු. 5,000,320 ක් අයකර ගෙන නොතිබුණු අතර එම බදු ප්‍රමාණය හිඟ බදු ලෙස හඳුනා ගෙන හිඟ බදු ලේඛනයේ ද සටහන් කර නොතිබුණි.	ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව නිත්‍යානුකූලව කටයුතු කිරිම සඳහා ඉඩම් කොමසාරිස් වෙත යොමු කිරිමට කටයුතු කරනු ලබන බව දන්වමි.	හිඟ ආදායම් ලේඛණගත කිරීමට හා අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	රාගල ග්‍රාම නිලධාරි වසමේ වාණිජ කටයුත්තක් සඳහා පර්චස් 47 ක් ද කෘෂිකාර්මික කටයුත්තක් සඳහා පර්චස් 40 ක්ද අදාල භුක්ති විඳින පාර්ශවය වෙත දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 21,447,200 ක බදු ආදායමක් අයවිය යුතුව පැවතුණි.	හිඟ බදු නොගෙවීම මත ප්‍රාදේශිය ලේකම් විසින් 2025.06.23 දිනැතිව බදු කරු වෙත අවසන් නිවේදනය යොමු කර ඇත	ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන හිඟ බදු ආදායම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මධ්‍යම පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 31 කට අදාලව රු. 122,693,096 ක හිඟ බදු ආදායමක් අදාල බදුකරුවන්ගෙන් අයකළ යුතුව පැවතුණි. ඉන් එකතුව රු. 115,299,115 ක හිඟ බදු ආදායමක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 ක බදුකරුවන්ගෙන් අයකර ගත යුතුව පැවති අතර එය මුළු හිඟ බදු ආදායමෙන් සියයට 94 ක් විය. 2024 දෙසැම්බර් 31 දිනට ආදායම් කාල විශ්ලේෂණය අනුව මුළු හිඟ බදු ආදායමින් සියයට 45 ක් එනම් රු. 54,967,929 ක් වර්ෂ 3ට වඩා කාලයක සිට හිඟව පැවතුණි.	හිඟ බදු ඇස්තමේන්තු සංශෝධනය වීම මත 2025.06.30 දිනට රු. 143,666,724.29 දක්වා වැඩි වී ඇති අතර එම මුදලින් 2025.06.30 දිනට රු.22,542,119.10 ක මුදලක් අය වී ඇති අතර තවදුරටත් රු.121,124,605.19 ක මුදලක් එම ප්‍රා/ලේ.කොට්ඨාශ 10 න් අය විමට ඇත.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු ය
(ඈ)	නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දීර්ඝ කාලීන බදු පදනම මත නේවාසික කටයුත්තක් සඳහා හෙක්ටයාර 0.253 ක ඉඩම් ප්‍රමාණයක් අදාල භුක්ති විඳින පාර්ශවය වෙත 2012 සිට ඉදිරි වර්ෂ 30 ක කාලයකට ලබා දී තිබුණි. 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු. 900,000 ක බදු මුදල් අයකර ගෙන නොතිබුණි.	වර්තමාන තත්වය විමසා 2025.05.16 දින ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇතත් පිළිතුරු ලැබී නොමැත.	ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන්රථ සේවයට අයත් මාතලේ කලාපීය පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩමෙන් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බදු වාරික වශයෙන් රු.1,280,000 ක් හා හිඟ පොළී වශයෙන් රු.960,000 ක් ලෙස එකතුව රු.2,240,000 ක හිඟ බදු ආදායමක් අයකර ගැනීමට කටයුතු කර	බදු ගෙවීම සඳහා දැනුවත් කර ඇති අතර බදු ගෙවීම පැහැර හරින බව නිරික්ෂණය වෙමින් පවතින බවත් අවසන් නිවේදනය ලබා දී ඉඩම් ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව නිත්‍යානුකූලව කටයුතු කිරිම සඳහා ඉඩම් කොමසාරිස් වෙත යොමු කිරිමට කටයුතු කරනු ලබන බව දන්වමි.	හිඟ ආදායම් ලේඛණගත කිරීමට හා අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

නොතිබුණු අතර එම බදු ප්‍රමාණය හිඟ බදු ලෙස හඳුනාගෙන හිඟ බදු ලේඛනයේ ද සටහන් කර නොතිබුණි.

1.5.10 ශීර්ෂය - 557 - මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සී/ස මධ්‍යම පළාත් වාහන ගණුදෙනු සමූපකාර සමිතියට අදාලව පළාත් ගිණුම්කාරක සභාවට යොමු වී ඇති තීරක ගොනු 15 අතරින් 2024 දෙසැම්බර් 31 දිනට ගොනු අවසන් කර නොමැති තීරක ගොනු 08 ක වටිනාකම රු. 27,415,860 ක් වී තිබුණි.	තීරක ගැටළු 07 අවසන් කර ඇත. ඉතිරි ගොනු 08 අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.	ඉතිරි වී ඇති තීරක ගැටළු අවසන් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ සමූපකාර සමිති අතරින් ප්‍රවර්ථන වර්ෂය අවසාන වන විට ගැටළුකාරී/අවධානම් සහිත ලෙස හඳුනාගෙන ඇති සමූපකාර සමිති 09 ක ගණුදෙනුකරුවන් 43,657 ක් සඳහා රු. 1,468,597,306 ක තැන්පතු ආපසු ගෙවීමට නොහැකි වී තිබූ අතර මෙම තැන්පතු මුදල් ගෙවා නිරවුල් කිරීම සම්බන්ධයෙන් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.	තැන්පත් ගෙවීම සම්බන්ධව අධි අවදානම් තත්වයේ පවතින මූල්‍ය අර්බුදයට ලක්ව ඇති සමිති වල අලාභ සඳහා වගකිවයුතු අයගෙන් අධිභාර කිරීමට අධිකරණ කටයුතු ආරම්භ කර ඇති අතර එතෙක් එම සමිති තැන්පතු ගෙවීම සඳහා ගෙවීම් සැලැස්මක් සකස් කර උසාවි දඩ මුදල් ලැබෙන පරිදි තැන්පත්කරුවන්ගේ මුදල් වාරික වශයෙන් ගෙවීමට සැලසුම් කර ඇත.	තැන්පතු මුදල් ගෙවා නිරවුල් කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රවර්ථන වර්ෂය අවසාන වන විට සමූපකාර සමිති සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද 46 (1) පරීක්ෂණ වලට අදාලව මහනුවර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 06 ක රු. 25,937,012 ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ සමිති 07 ක රු.240,213,723ක්ද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමිති 05 ක රු. 78,290,181 ක එකතුව සමිති 18 ක රු.344,440,916 ක වටිනාකමක අධිභාර සහතික නිකුත් කර තිබුණද එම අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	දිස්ත්‍රික්ක 03 ට අදාළ සමිති 03 ක අධිකරණයේ නඩු විභාග වෙමින් පවතින අතර සෙසු සමිතිවල 46(1) පරීක්ෂණයන්ට අදාල අලාභයන් අය කර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට අධිභාර ක්‍රියාවලිය විවිධ පියවරයන්හි කටුයතු කරමින් පවතින බව දන්වමි.	අධිභාර කර ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2024 දෙසැම්බර් 31 දිනට සමූපකාර සංවර්ධන අරමුදලින් ලබාදී තිබූ ණයවලින් සමූපකාර සමිති 74 කින් රු.73,591,580 ක ණය ශේෂ අය නොවී පැවතුණු අතර, කාල විශ්ලේෂණයට අනුව අවුරුදු 0 – 03 ත් අතර සමිති 70 කින් රු.72,234,672 ක්ද, අවුරුදු 03–06 අතර සමිති 04කින් රු. 881,423 ක්ද, අවුරුදු 18 ට වැඩි සමිති 02කින් රු.475,485 ක ණය ශේෂයන්ද අය නොවී පැවතුණි.	සමූපකාර අරමුදලෙන් ලබා දී තිබූ ණයවලින් සමිති 74 කින් 2024 දෙසැම්බර් 31 දිනට රු.73,591,579.69 ක් අයවීමට පවතින බව සඳහන් කරමි.	ණය මුදල් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඉ)	පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමූපකාර සමිති 1692 න් සමිති 1212 ක් අක්‍රිය සමිති බවට පත්ව තිබූ අතර දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ සමිති 490 ක් විගණනය කිරීමට සැලසුම් කළද වර්ෂය අවසාන වන විට සියයට 36 ක් හෙවත් සමිති 179 ක් විගණනය සිදු කර නොතිබුණි.	2024 වසරේ විගණනය සිදුකිරිමට සමිති 129 ඉතිරිව පවතින බව කාරුණිකව සඳහන් කරමි.	සැලසුම් කරන ලද සියළුම සමිතිවල විගණන කටයුතු සිදු කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමූපකාර සංවර්ධන අරමුදලට මහනුවර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 229 කින් රු. 159,603,797 ක්ද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 92 කින් රු. 48,442,481 ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 159 කින් රු. 54,443,311 ක්ද ලෙස එකතුව රු. 262,489,589 ක වටිනාකමක දායකත්වයක් අය නොවී පැවතුණි.	අරමුදල් අයවීමේ ප්‍රගතිය සාකච්ඡාවට භාජනය කරමින් දායකය අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවරයන් ගනිමින් පවතින බව තවදුරටත් දන්වමි.	සමූපකාර සංවර්ධන අරමුදලට දායක මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය

1.5.11 ශීර්ෂය 561 - මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඖෂධ නියාමනය හා ඖෂධ බෙදාහැරීම කළමණාකරණය කිරීමේ අරමුණින් හඳුන්වා දී තිබුණු ස්වස්ථා ඖෂධ කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක වුවද තොරතුරු ලබා ගන්නා ලද රෝහල් 16 ක හා මහනුවර ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ රු.788,471,201 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ තොග දක්නට ලැබුණි. එමෙන්ම රෝහල් 10 කට අදාළ වටිනාකම හඳුනාගත නොහැකි කල් ඉකුත් වූ ඖෂධ වර්ග 332 ක් දක්නට ලැබුණි.	මු.රෙ. 104(4) පරීක්ෂණ කමිටු වෙත යොමු කර කඩිනමින් ඉදිරි කටයුතු සිදු කරමි.	ඖෂධ නියාමනය හා ඖෂධ බෙදාහැරීම කළමණාකරණය කරගත යුතුය.
(ආ)	පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික්ක 03 හි ප්‍රාදේශීය රෝහල් 06 ක හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ රු.14,557,718 ක් වටිනා ඖෂධ වර්ග 426 ක ඖෂධ ඒකක 1,265,294 ක් කල් ඉකුත්වී තිබුණි.	ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල මඟින් සිදු කර ඇති සෞඛ්‍ය ආයතනවල පවතින කල්ඉකුත් වූ ඖෂධ වලට අදාළ මු. රෙ. 104(3) වාර්තා වටිනාකම අනුව අදාළ මු.රෙ. 104(4) පරීක්ෂණ කමිටු වෙත යොමු කර කඩිනමින් ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව සඳහන් කරමි.	.මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික්ක 02 ක ප්‍රාදේශීය රෝහල් 02 හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ රු.5,017,350 ක් වටිනා ඖෂධ වර්ග 66 ක	තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ සම්බන්ධයෙන් කොළඹ ප්‍රධාන වෛද්‍ය සැපයුම් අංශය විසින් විස්තර ඉල්ලා ඇති අදාල තොරතුරු සපයමින් පවතින අතර	ඖෂධ නියාමනය හා ඖෂධ බෙදාහැරීම් කළමණාකරණය

	ඖෂධ ඒකක 144,034 ක් තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ තොග පැවතුණි.	ඉදිරි කටයුතු කොළඹ ප්‍රධාන වෛද්‍ය සැපයුම් අංශය විසින් සිදු කරනු ලබයි.	කළ යුතුය.
(ඈ)	2019 මැයි 09 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් නිලධාරින් 14 දෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණු, මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණ වල තීන්ත ආලේප කිරිම වෙනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණු රු.3,114,905 ක මුදලෙන් 2024.12.31 දිනට නිලධාරින් 06 දෙනෙකුගෙන් රු.1,432,562.35 ක් අයකර ගෙන නොතිබුණි.	නිලධාරීන් 09 දෙනකු වෙතින් අයවිය යුතු මුදල් සම්පූර්ණයෙන් අයවී අවසන්ව ඇත.එක් නිළධාරියෙකුගෙන් අධිභාර කිරීමට ඇති මුදල අයකර ගැනීමට නඩු පවරා ඇති අතර අනෙක් නිළධාරින් 04 දෙනාගෙන් අධිභාර කළ යුතු මුදල් විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.	අදාළ නිළධාරීන්ගෙන් අයකර ගත යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2016 සිට 2021 දක්වා කාලසීමාව තුළ මධ්‍යම පළාත් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැටුප් සැකසීමේ දී වැටුප් රාජකාරි ඉටු කළ නිලධාරින් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ හා සමීපතයන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් 14 කට රු.51,961,088 ක් සහ බැංකු ගිණුම් අංක මඟින් තහවුරු නොවන රු.1,077,550 ක් වශයෙන් එකතුව රු.53,038,638 ක මුදලක් සාවද්‍ය ලෙස ප්‍රේෂණය කිරීමෙන් සිදු ව ඇති වැටුප් වංචාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් වංචා කළ මුදලෙන් රු.50,440,089ක මුදලක් අය කර ගැනීමට අදාළ බලධාරින් කටයුතු කර නොතිබුණි. එසේම වැටුප් කට්ටල වලට අදාල ලිපිගොනු හා ලේඛන පරිගණක මෘදුකාංග උපස්ථිත (Backup) විධිමත්ව හා සම්පූර්ණව ඉදිරිපත් නොකිරීම හා මුරපද අමතක වීම, තාක්ෂණ දෝෂ පැවතීම හේතුවෙන් පරිගණක 02 ක උපස්ථිත (Backup) වලට ප්‍රවේශ වීමට නොහැකි වීම වැනි හේතු මත එම කාල සීමාවට අදාලව වංචා කර ඇති සම්පූර්ණ මුදල නිශ්චිතව හදුනා ගැනීමට ද මෙතෙක් නොහැකි වී තිබුණි.	ප්‍රධාන චූදිතයන් දෙදෙනා සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ග සිදු වෙමින් පවතී. තවත් නිලධාරියෙකු සම්බන්ධයෙන් විනය කටයුතුවලට අදාළ කමිටුවක් ප්‍රධාන ලේකම් විසින් පත්කර ඇති අතර, එහි කටයුතු ප්‍රධාන අමාත්‍යාංශය මඟින් සිදුකරමින් පවතී. මු.රෙ. 104 (4) පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව මෙම වංචාවට අදාළ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාළ තොරතුරු පත්වීම් බලධාරියා වෙත යොමු කර ඇත.	මු.රෙ 104(4) අනුව වගකිව යුතු අයගෙන් අදාල මුදල් අයකරගත යුතුය.
(ඊ)	මාරස්සන ප්‍රාදේශීය රෝහලේ විගණිත දිනය වූ 2025 ජනවාරි 22 දින වන විට භෞතික තොග පරීක්ෂාවේදී ඖෂධ ගබඩාව තුළ පැවති රු.919,541 ක් වටිනාකමැති කල්	මූලික පරීක්ෂණයක් සිදුකිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටු වාර්තාවේ නිර්දේශ මත අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව	මුදල් රෙගුලාසි පරිදි කටයුතු කල යුතුය.

	ඉකුත්වූ ඖෂධ වර්ග 09 ක් ඖෂධ ගබඩාවේ පැවති බවත් මාරස්සන ප්‍රාදේශීය රෝහලේ 2019 මැයි සිට 2024 අගෝස්තු දක්වා කාල පරිච්ඡේදයට අදාළව රු.2,161,205 ක වටිනාකම් සහිත ඖෂධ වර්ග 141 ක ඒකක 302,306 ක් කල් ඉකුත්වීම මත,එම ඖෂධ ආයතන භාර වෛද්‍ය නිලධාරී නිවාසය තුළ හා පවුල් සෞඛ්‍ය සේවිකා නිල නිවාසය තුළ වර්ෂාවට තෙමීම හා කෘමි සතුන්ගෙන් විනාශ වීමට ඉඩහැර අනාරක්ෂිතව රඳවා තිබුණි.	සඳහන් කරමි.	
(උ)	නියැදි පරීක්ෂාවේදී දිස්ත්‍රික්ක 03 හි ප්‍රාදේශීය රෝහල් 06 ක හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ රු.14,557,718 ක් වටිනා ඖෂධ වර්ග 426 ක ඖෂධ ඒකක 1,265,294 ක් කල් ඉකුත්වී තිබුණි.	මු.රෙ. 104(4) පරීක්ෂණ කමිටු වෙත යොමු කර කඩිනමින් ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව සඳහන් කරමි.	මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය.
(ඌ)	මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව අනතුරු/ අලාභ හානිය සිදු වූ දින සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට දක්වා තිබුණද වාහන අනතුරු 05 කට අදාළව මාස 04 සිට අවුරුදු 13ක් දක්වා අතර කාලයක් ගතවුවද පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි	සියළු වාහන අනතුරු සම්බන්ධයෙන් මු. රෙ. 104(4) පරීක්ෂණ සිදුකරමින් පවතින බව දන්වමි.	මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.5.12 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් භෞතිකව ඉදිකර නොතිබුණු රාගල බස් රථ ගාල තුළ කඩ කාමර 79කින් ලැබිය යුතු කඩකාමර කුලී ලෙස රු.8,821,200 ක් සහ අධිභාර ලෙස රු.441,560ක් ගිණුම්වල දක්වා තිබුණි.	මෙම භෞතිකව ඉදි කර නොමැති කඩ කාමරවල ලැබිය යුතු කුලී සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු වාර්තා කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	ඉදි නොකළ කඩ කාමර සඳහා කුලී අය කිරීම නිවැරදි කළ යුතුය.
(ආ)	පොදු ප්‍රවාහනයෙහි පවතින දුර්වලතා මග හරවා ගැනීම සහ විධිමත් පාලනයකින් හා අධීක්ෂණයකින් යුතුව මහජන කේන්ද්‍රීය පොදු සේවාවන් සැලසීම සඳහා නව තාක්ෂණය භාවිතා කරමින් තොරතුරු ලබා ගැනීම සහ විශ්ලේෂණය කිරීම ප්‍රධාන ඉලක්ක කරගත් තිරසාර සංවර්ධන දැක්මකින් යුතුව වර්තමානයේදී ක්‍රියාත්මක වන මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරිය, ප්‍රතිව්‍යුහගත	ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව අරමුදල් මෙහෙයවීමට කටයුතු කරමි.	ව්‍යාපෘති අරමුණ ඉටුකර ගැනීමට අරමුදල් මෙහෙයවිය යුතුය.

	කිරීමේ නවමු පියවරක් ලෙස මහනුවර නගරයේ පවතින බස් පර්යන්ත මෙහෙයුම සඳහා නව අත්දැකීමක් මත නව පෙනුමක් හා නව ශක්තියකින් ලබා දීම අරමුණු කරගනිමින් මහනුවර නගරයේ ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පොල කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කිරීමට බහුමාදිලි ප්‍රවාහන පර්යන්තයේ මෙහෙයුම් හා පාලන කටයුතු සැළසුම් කිරීමේ කාර්ය සඳහා පළමු අදියර ලෝක බැංකු ආධාර ව්‍යාපෘතිය යටතේ මහ නගර හා බස්නාහිර සංවර්ධන ව්‍යාපෘතිය සහ මගී ප්‍රවාහන සේවා අධිකාරිය 2018 සැප්තැම්බර් 28 දින සිට වර්ෂ 03ක කාලයක් සඳහා රු.174,172,025කට ඇති කරගෙන තිබූ අවබෝධතා ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගිවිසුම් ගත වී වර්ෂ 05ක් ඉක්ම යන විට රු.128,186,579 ක් වැය කර තිබුණ ද ඉන් රු.95,829,962 ක් එනම් සියයට 74.75 ක ප්‍රමාණයක් වැටුප් හා වේතන හා නඩත්තු කටයුතු සඳහා ගෙවීම් කර තිබූ අතර ඉතිරි සියයට 25.24 ක ප්‍රතිශතයක් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට වැය කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.		
(ඈ)	සමාලෝචිත වර්ෂයේ සුභසාධන වැඩසටහන් ලෙස අධිකාරියේ රු.3,531,774 ක් මුදල් වෙන්කර ගෙන 2024 සිංහල - හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 7 දෙනෙකුට සහ අධිකාරියේ විධායක මට්ටමේ සියළු නිලධාරීන් ඇතුළු අනෙකුත් නිලධාරීන්/සේවකයින් 230 දෙනෙකුට වියළි ආහාර මල්ලක් ලබා දී තිබුණි.	ඉදිරියේ දී මෙවැනි තත්වයන් ඇති නොවීමට කටයුතු කරමි.	ප්‍රඥප්තියේ සඳහන් අරමුණු සඳහා වියදම් දැරිය යුතුය.
(ඇ)	පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ සේවය කල කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 03 දෙනෙකු සිදු කල රු 253,400 මුල්‍ය වංචාවට අදාලව සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 06 කට ආසන්න කාලයක් ගතවී ඇතැත් මු.රෙ 104 පරීක්ෂණ සිදු කර අලාභය අය කර නොතිබුණි.	මු.රෙ. 104 පරීක්ෂණ පවත්වා කඩිනම් කිරීමට කටයුතු කරමි.	පරීක්ෂණ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු වේ

(ඉ)	පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය වෙත ලැබී තිබුණු 2366ක GPS යන්ත්‍ර සවිකිරීම සඳහා ඉංජිනි ලංකා ආයතනයට ලබා දී තිබුණු අතර එම සමාගම විසින් රු 6,645,045 ක්වූ GPS යන්ත්‍ර 561ක් සවිකර නොතිබුණු අතර එම සවිනොකරන ලද GPS යන්ත්‍ර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අදාළ වගකිවයුතු නිලධාරීන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කර ඇති අතර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව සඳහන් කරමි.	සවි නොකළ GPS යන්ත්‍ර සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් කඩිනමින් ගත යුතුය.
(ඊ)	උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියට අදාලව අධිකාරියට ලද ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර 1650 න් 1158 ක් බස් හිමියන් වෙත නිකුත් කලත් එයින් යන්ත්‍ර 143ක් අලුත් වැඩියා කිරිමට නැවත භාරදි ඇත. ඉතිරියෙන් ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර 218 ක් සහ 274ක් පිළිවෙලින් අක්‍රිය තත්වයේ හා ඉතිරි ප්‍රවේශ පත්‍ර නිකුත් නොකර ගබඩාවේ රදවාගෙන වසර 4කට ආසන්න කාලයක් ගත වි තිබුණි. එහි වටිනාකම රු22,623,424 ක් විය.	ඉතිරි ප්‍රවේශපත්‍ර යන්ත්‍ර නිකුත් කිරීම සඳහා බස් රථ හිමියන් ලියාදිංචි කටයුතු සිදු කර ඇත.ඒඅනුව ප්‍රවේශපත්‍ර යන්ත්‍ර නිකුත් කරමින් පවතින බව සඳහන් කරමි.	ප්‍රවේශපත්‍ර යන්ත්‍ර කඩිනමින් ප්‍රයෝජනයට ගැනීම කළ යුතුය.
(උ)	2024 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රසම්පාදන අංක CPC/TA/P/2024/13 මගින්, මගී ආවරණ 36ක් ඉදි කිරීම වෙනුවෙන් තෝරා ගත් ලංසුකරු වන වැලි අංග කන්ස්ට්‍රක්ෂන් සමාගම විසින් ඉදිරිපත් කල ලංසුව අනුව එහි වටිනාකම රු.8,540,942ක් වුවද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් ක්‍රියාවලිය තුළදී ලංසුකරු ඉදිරිපත් කළ මිල රු.9,498,938ක් ලෙස යොදා ගනිමින් එනම් රු.957,996 ක වටිනාකමක් වැඩිපුර එකතු කොට අදාල කොන්ත්‍රාත්කරුට රු.9,498,938 ක අධි මිලකට කොන්ත්‍රාත්තුවට ප්‍රදානය කර තිබුණි. මේ පිළිබඳ විගණනය විසින් සිදු කරන ලද වැඩිපුර පරීක්ෂා කිරීම් වලදී අදාළ කොන්ත්‍රාත්තුව යටතේ මගී ආවරණ 40ක් ඉදිකර ඇති අතර ඉදිකරන ලද එක් මගී ආවරණක් සඳහා රු.14,458 බැගින් මගී ආවරණ 40 සඳහා රු.578,320 ක් වැඩියෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.	මගී ආවරණ 36 ක් සඳහා වැලි අංග කන්ස්ට්‍රක්ෂන් (තෝරා ගත් ලංසු කරු) ආයතනය විසින් BOQ 01 යටතේ මගී ආවරණ සඳහා ඉදිරිපත් කර ඇති මුදල රු. 8,540,942 ක් වේ. තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ලංසු ඇගයීමේදී අයිතම අංක 1.5 හා 1.6 මිල ගණන් නිවැරදි කරන ලදී. BOQ 01 සඳහා තාක්ෂණික ඇගයීමට අනුව රු. 9,498,938 ක් වූ බැවින් කොන්ත්‍රාත් කරුට වැඩිපුර මුදල් ගෙවා නොමැත.	ලංසු කරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙනස් කළ නොහැකි අතර කොන්ත්‍රාත් කරුගේ බිල් පත අනුව මගී ආවරණ 40 සඳහා වැඩිපුර ගෙවූ රු. 578,320 ක මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීමට කටයුතු කළ යුතුය.

1.5.13 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය විසින් අළුත්වැඩියා කරන ලද වාහන යන්ත්‍ර වලට අදාලව 2010 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 16 දිනට අයවිය යුතු හිඟ ආදායම රු.12,815,841 කුත් 2014 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 18 දිනට ලැබිය යුතු හිඟ යන්ත්‍ර කුලී ආදායම් රු.7,129,842 ක් විය.	අදාල ආයතන වෙත ලිපි යොමු කර ඇති බව පෙන්වා දෙමි.	හිඟ ආදායම් අයකර ගත යුතු වේ.
(ආ)	2023 නොවැම්බර් 27 දින නිම කල දිගින් මීටර් 1000ක් සහිතව ඉදිකර ඇති තලාතුඔය කන්දකැපුතැන්න මාර්ගයේ (5+300 – 6+300 Km) ABC (Aggregate Base Course) ඇතිරිමේ දී සමකල මිනුම් (Level Measurement) ගණනය කිරීමත් සිදු නොකර මිලි මීටර් 150ක සාමාන්‍ය ඝනකමක් (Thickness) සහිතව ඇතිරිම කර තිබු බවට බිල්පතෙහි සඳහන් කර මීටර් කියුබ් (Cu.m) 965 ක් සඳහා රු.5,211,000 කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. නමුත් ක්ෂේත්‍ර පරික්ෂාවේදී ABC ලේයරයේ සාමාන්‍ය ඝනකම මිලි මීටර්111.3 ක් බව නිරික්ෂණය විය. ඒ අනුව ABC මීටර් කියුබ් (Cu.m) 247.7 ක් සඳහා රු.1,337,580 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.	අදාල මාර්ගයේ Level වලට මිණුම් ගෙන අදාල කර්මාන්තය සිදු කිරීමට නම් ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේ සිට Level මිණුම් ලබාගෙන කර්මාන්තය සිදුකල යුතුය. එසේම ඒ සඳහා මාස 03 කට අධික කාලයක් කර්මාන්තය සිදු කිරීමට ගත වන අතර ඒ සඳහා Price excalation සකස්කල යුතුය. ඒ සඳහා අමතර මුදලක් දැරිය යුතුය. 2025 වර්ෂයේ සිට සියළු මාර්ග ඉදිකිරීම Level මඟින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බවද දන්වා සිටිමි.	ඇස්තමේන්තු නිවැරදිව පිළියෙළ කළ යුතු අතර වැඩිපුර ගෙවන මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	තලාතුඔය කන්දකැපුතැන්න මාර්ගයේ (5+300 – 6+300 Km) ඇස්ෆෝල්ට් ඇතිරීමේදී Asphalt Wearing මිලි මීටර් 40 ඝනකමක් (Thickness) සහිතව ඇතිරීම කර තිබු බවට සඳහන් කර ගෙවීම් කර තිබුණු අතර මෙම මාර්ගයට Asphalt Wearing මිලදී ගැනීම සඳහා සැපයුම්කරුට මෙට්‍රික් ටොන් (MT) 443.78 ක් වෙනුවෙන් රු.7,601,951 ක් ගෙවීම් කර තිබුණි. 2024 ජනවාරි 02 දිනැති රසායනාගාර වාර්තාව අනුව පරික්ෂා කල Core Thickness හි සාමාන්‍ය ඝනකම මිලි මීටර් 33.125 ක් වීම හේතුවෙන් ICTAD Publication No-SCA/5/506.6(a) (i) අනුව රු.1,520,390 ක් Asphalt Wearing සඳහා වැඩිපුර ගෙවා තිබුණි.	මෙහිදී සම්පූර්ණ Asphalt ප්‍රමාණයට අදාල මාර්ගයට ලැබුණු පසු මාර්ගයේ ඇතිරීම සිදු කරන ලද අතර ඒ අවස්ථාවල ඇති වූ අපහසුතා නිසා නියමිත ඝණකම පවත්වා ගෙන යාමට නොහැකි වූ අතර ඒවා යන්ත්‍ර සූත්‍ර වල දෝෂයන් හා කාලගුණ තත්වයේ ඇති වූ අපහසුතා නිසා සිදු වූ අත්වැරදීමක් වූ අතර හැකි උපරිම ප්‍රමාණයෙන් නිසි ප්‍රමිතිය පවත්වා ගැනීමට උත්සාහකර ඇති බැවින් මහජන මුදල් කිසිසේත්ම අවභාවිතාවක් සිදු වී නොමැති බවද පෙන්වා දෙමි.	ICTAD Publication No-SCA/5 හි 506.6 (a) (i) ප්‍රකාරව ගෙවීම් සිදු කළ යුතුය.
(ඈ)	දිගින් මීටර් 1000 ක් සහිතව ඉදිකර ඇති හාගල ගිරිඇල්ල ගෝමරය මාර්ගයේ (0+000 - 1+000 Km) ABC (Aggregate Base Course) ඇතිරීමේදී සමතල මිණුම් (Level	මෙහිදී කොන්ත්‍රාත් කාලය සැලකිල්ලට ගෙන (දින 39) මට්ටම් ගැනීමකින් තොරව ගොනු මිනුම් ගැනීමක් මගින් ද්‍රව්‍ය සැපයීම් පරික්ෂා කරන ලදී. මෙහිදී අදාල ගොනු	මාර්ගයන් ඇතිරීමට ප්‍රථම සමතල මිනුම් ලබාගෙන

	Measuremente) ගණනය කිරීමක් සිදු නොකර මිලි මීටර් 150 ක සාමාන්‍ය ඝනකමක් (Thickness) සහිතව ඇතිරීම කර තිබූ බවට බිල්පත්‍රයෙහි සඳහන් කර කියුබික් මීටර් (Cu.m) 759 ක් සඳහා රු. 4,174,500 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. එසේ වුවත් ක්ෂේත්‍ර පරික්ෂා කිරීම් අනුව ABC ලේයරයේ සාමාන්‍ය ඝනකම මිලි මීටර් 126.3 ක් වීම හේතුවෙන් ABC මීටර් කියුබ් (Cu.m) 118.4 ක් සඳහා රු.651,315 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.	මිනුම් කොන්ත්‍රාත් පාර්ශවය , විධායක ඉංජිනේරු කාර්යාලය හා ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය මගින් ඒකාබද්ධ මිනුම් ගන්නා ලදී.එලෙස මිනුම් ගැනීමක් සිදු වන්නේ මාර්ගය ස්ථානීය පරීක්ෂාවන් මගින් අදාල ABC ප්‍රමාණය තීරණය කල නොහැකි බැවිනි. මෙහිදී ස්ථානීය පරීක්ෂාවක් මගින් ABC ප්‍රමාණය තීරණය කල හැකි එකම ක්‍රමවේදය වන්නේ මාර්ගය ඉදිකිරීමට පෙර හා පසු Levelling Instrument භාවිතා කොට 20 mm පරතරයෙන් මට්ටම් ගෙන අදාල අරය සඳහා වූ ප්‍රමාණය ගණනය කිරීමෙනි.නමුත් සැලකිය යුතු ප්‍රමාණයකින් මාර්ගයේ වලවල් තිබූ බැවින් අදාල මාර්ගයේ 20 m ක පරතරයෙන් මිනුම් ගැනීමෙන්ද එම අතර පවතින වලවල් සඳහා අවශ්‍ය වන ABC ප්‍රමාණය තීරණය කල නොහැකිය. එබැවින් විශාල ලෙස කඩතොළු පැවති මෙම මාර්ගය සඳහා ගොනු මිනුම් ගැනීම මගින් ආ ප්‍රමාණය තීරණය කිරීම වඩාත් සාධාරණ ක්‍රමවේදය වේ. මෙහිදී වැඩ පරිපාලක හා තාක්ෂණ නිලධාරිගේ අධීක්ෂණය යටතේ අදාල ABC ඇතිරීම සිදු කරනු ලැබේ.	ඇස්තමේන්තු කර ඒ අනුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	පේර වංගුව සහ ගලහා පාලමේ යකඩ කපා පාලම ගැලවීමට පෙර යකඩ කොටස් ගණනය කර ඇති අතර ඒ අනුව යකඩ කිලෝ 10,525 තිබූ බව සඳහන් වුවද. ඒ අනුව කපා ඉවත් කර ඇති යකඩ කිලෝ ප්‍රමාණය සහ එම යකඩ වල මිල ගණන් පිළිබඳ තක්සේරු වාර්තාවන් මත පදනම්ව සිදු වූ අලාභය තක්සේරු කොට ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම හෝ අදාල සියළු පාර්ශවයන්ට චෝදනා පත්‍ර ගොනු කොට අවශ්‍ය විධිමත් විනය පරික්ෂණයන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම කමිටු වාර්තා අනුව රජයට වූ අලාභය අයකරගැනිමටත් ඊට සම්බන්ධ වූවන්ට සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2013 ජූනි 26 දින අංක 10/2013 දරණ රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 3.2 ඡේදය අනුව සියලු ආයතන විසින් දීමනා සඳහා වන ඉල්ලීම්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපතක් සහිතව, අදාල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ	මෙම දීමනාව ලබා දීම සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ලබා දුන් අනුමැතිය මාර්ග සංවර්ධන අමාත්‍යාංශ ලේකම් ගේ නිර්දේශ සහිතව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇත. එසේම 2024.06.27 දිනැති මෙම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව මධ්‍යම	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

	රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වුවත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අදාල අනුමැතීන් ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත විධායක ශ්‍රේණියේ නිලධාරීන් 13 දෙනෙකු වෙත ජුනි සිට සැප්තැම්බර් දක්වා රු.1,300,000 ක මුදලක් විධායක දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි.	පළාත් ප්‍රධාන ලේකම් විසින්, එය මධ්‍යම පළාතේ ආයතන වලට අදාල කර ගන්නා ලෙස CPC/CS/01/24/01/02/01(l) හා 2024.07.16 දිනැති ලිපිය) මඟින් දන්වා ඇත.	
(උ)	2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාහන අලුත්වැඩියා ගිණුමේ ඇති ශේෂය වන රු.12,815,841 තුල ඇතුළත් වසර 5 කට, වසර 03කට සහ වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අයනොවූ ශේෂයන් ලෙස පිළිවෙලින් රු.4,321,577ක්, රු.130,019ක් සහ රු.551,386ක මුදලක් අන්තර්ගතව ඇති නමුත් කළමනාකරණය විසින් එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	එසේ අය කරවා ගැනීමට අපොහොසත් වූ ලැබිය යුතු ආදායම් අය කරවා ගැනීම සඳහා අදාල ආයතන වෙත ලිපි යොමු කර ඇත.	අය නොවූ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	හාගල ගිරිඇල්ල ගෝමරය මාර්ගයේ (0+000-1+000 Km) Asphalt Wearing වර්ග මීටර් (sq.m) 3564 ක් අතුරා ඇති බවට බිල්පතෙහි සඳහන් කරමින් ගෙවීම් කිරීමට පෙර Asphalt Wearing හි ඝනත්වය (Density) පරික්ෂා කිරීම Marshall Density Test හෝ වෙනයම් පරික්ෂණයක් සිදුකිරීමට කටයුතු කර නොකර අවිධිමත් ලෙස රු.8,910,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි.	• රසායනාගාරයේ අදාල පරික්ෂණ සඳහා උපකරණ නොමැත. • ඇස්ෆෝල්ට් සම්පීඩනය කිරිමට අවශ්‍ය නියමිත උෂ්ණත්වය හා භාවිතා කල යුතු සම්පීඩනයන්ට (PTR හා Static Roller භාවිතා කිරිම හා ඒවායේ සම්පීඩනය වාර ගණන පිළිබඳව වැඩ පරිපාලක හා තාක්ෂණ නිලධාරි විසින් පරික්ෂාව සිදු කරනු ලැබේ.	ගෙවීම් කිරීමට ප්‍රථම අදාළ Marshall Density Test හෝ වෙනයම් පරික්ෂණයක් සිදුකර ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.
(එ)	• දිගින් මීටර් 2150 ක් සහිත ඉදිකර ඇති කොලබිස්ස පට්ටියගම මාර්ගයේ (6+100-7+630 KM) සහ (5+520-6+100KM) Asphalt ඇතිරීමේ දී Asphalt wearing මිලි මීටර් 50 ඝනකමක් (Thickness) සහිතව, Asphalt Binder මිලිමීටර් 32.5 ක සාමාන්‍ය ඝනකමටත් (Thickness) සහිතවද ඇතිරීම කර තිබූ බවට සඳහන් කර ගෙවීම් කර තිබුණි. මෙම මාර්ගයට Asphalt wearing මිලදී ගැනීම සඳහා සැපයුම්කරුට මෙට්‍රික් ටොන් (MT) 979.89 ක් වෙනුවෙන් රු.25,957,286 ක් ගෙවීම් කර තිබුණි. ක්ෂේත්‍ර පරික්ෂා කල Asphalt wearing හි Core Thickness මිලි මීටර් 42.68 ක් වූ බැවින් ICTAD Publication No-ScA/S හි 506.6(i) හි 506-5 වගුව ප්‍රකාරව ගෙවීම්	ඉහත කර්මාන්තය 2022 වර්ෂයේ සිදුකර ඇති අතර කර්මාන්තය සිදු කරන අවස්ථාවේදී Core sample ලබා ගෙන ඇති අතර ඉහත මාර්ගය හරහා කොළඹිස්ස - පට්ටියගම, දෙල්තොට - වාඩියගොඩ , ගලහ , ඇකිරිය වැනි ගම්මාන රැසකට බස් රථ , ලොරි රථ ,හා වෙනත් වාහන විශාල ප්‍රමාණයක් දිනකට ධාවනය වීම හේතුවෙන් හා ඉහත මාර්ගය 2022 වර්ෂයේ සිදුකර ඇති බැවින් වර්ථමානය වන විට ඉහත මාර්ගය වැඩි වශයෙන් වාහන ධාවනය වන මාර්ගයක් බැවින් කාලයක් සමග ඇස්ෆෝල්ට් ස්ථරය යම් මට්ටමකින් ක්ෂය විමට හා අධි සම්පිඩන තත්වයකට පත්විම හේතුවෙන් අඩු ඝනකමක් පෙන්නුම් කරන බව	ICTAD Publication No-ScA/S හි 506.6(i) හි 506-5 ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	කර හැකි ප්‍රතිශතය අනුව රු.5,191,457 ක් Asphalt wearing සඳහා වැඩිපුර ගෙවා තිබුණි.	විධායක ඉංජිනේරු විසින් පෙන්වා දී ඇත.	
	• මෙම මාර්ගයට Asphalt Binder මිලදී ගැනීම සඳහා සැපයුම්කරුට මෙට්‍රික් ටොන් (MT) 600.85 ක් වෙනුවෙන් රු.15,916,517 ක් ගෙවීම් කර තිබුණි. මාර්ගයට Asphalt Binder ඇතිරීමේදී සමතල මිනුම් (level Measurement) ගණනය කිරීමක් සිදුකර නොතිබූ අතර මුළු මාර්ගය සඳහාම සාමාන්‍ය ඝනකම මිලි මීටර් 32.5 ක් ලෙස Asphalt Binder අතුරා ඇති බව මැනුම් පත්‍රයේ සඳහන් කර ගෙවීම් කර තිබුණි. එසේ වුවත් සිදුකල Core Cutting පරීක්ෂාවේ දී Asphalt Binder හි සාමාන්‍ය ඝනකම අනුව පරීක්ෂා කල Core Thickness මිලි මීටර් 22.31 ක් වීම හේතුවෙන් රු.4,132,504 ක් Asphalt Binder සඳහා වැඩිපුර ගෙවා තිබුණි.	ABB සඳහා ගෙවීම් සිදු කිරීමේදී ICTAD Publication No – SCA/S හි 506.2 අනුව බර ප්‍රමාණය අනුව ප්‍රමාණය තහවුරු කරගෙන ගෙවීම් සිදුකර ඇත. එමෙන්ම ඉහත මාර්ගය කොළඹිස්ස - පට්ටියගම, දෙල්තොට, වාඩියගොඩ, ගලහා, ඇකිරිය වැනි ගම්මාන රැසකට බස්රථ, ලොරිරථ, හා වෙනත් වාහන විශාල ප්‍රමාණයක් දිනකට ධාවනය වන බැවින් හා අදාල ඉදිකිරීම 2022 වර්ෂයේ සිදුකර ඇති බැවින් කාලයක් සමග ඇස්ෆෝල්ට් ස්ථරය යම් මට්ටමකින් ක්ෂය වීමට හා අධි සම්පීඩන තත්වයකට පත්වීම හේතුවෙන් අඩු ඝනකමක් පෙන්නුම් කරන බව විධායක ඉංජිනේරු විසින් පෙන්වා දී ඇත.	ගෙවීම් කිරීමට ප්‍රථම අදාළ පරීක්ෂාවන්ගේ මිනුම් ප්‍රතිඵල අනුව ගෙවීම සිදු කළ යුතුය.
(ඒ)	කොලබිස්ස පට්ටියගම මාර්ගයේ (6+100-7+630 KM) සහ (5+520-6+100 KM) මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2022 ඔක්තෝබර් මස සැලසුම්කර ඇති අතර 2022 සැප්තැම්බර් මස ගූගල් සිතියම සඳහා ලබාගත් ඡායාරූප අනුව මෙම මාර්ගයේ සංවර්ධන කලයුතු මට්ටමේ නොමැති හොඳ තත්ත්වයේ පවතින මාර්ගයක් බව දක්නට ලැබුණි. ඒ අනුව මෙම කර්මාන්තයට දරන ලද රු.48,967,365 මුදල නිෂ්කාර්ය වියදමක් වේ.	අදාල මාර්ගයේ Asphalt අතුරා දෙන ලෙස විශාල වශයෙන් මහජන ඉල්ලීම් තිබූ අතර දෙල්තොට ප්‍රාදේශීය සංවර්ධන කමිටු වලදීද බොහෝ අවස්ථාවල ඉල්ලීම් ඉදිරිපත්කර තිබුණි. මහජන ඉල්ලීම් සලකා බලා එවකට Asphalt යොදා තිබූ කොටසේ සිට ඉදිරියට 2022 ප්‍රතිපාදන යටතේ සිදු කිරීමට තීරණය කල අතර 7+630 km සිට 5+500 km කොටස තුල මාර්ගය දිරාගොස් තිබූ අතර මාර්ගයේ ගොඩැලි ස්වභාවයක් හා Uneven Surface තත්වයක් මාර්ගයේ තිබුණි.	නිසි අධ්‍යනයකින් යුතුව සුදුසු මාර්ග තොරා ගනිමින් එම මාර්ග නඩත්තු කටයුතු සිදු කළ යුතුය.
(ඔ)	සමාලෝචිත වර්ෂයේ දී රු.5,437,600ක් වියදම් කර සුභසාධන වැඩසටහන් ලෙස 2024 වර්ෂයේ සිංහල - හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් එක් බඩු මල්ලක වටිනාකම රු.9,710 ක් වූ වියළි ආහාර බඩුමලු 560 ක් ලබා දීමට කටයුතු සංවිධානය කර පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරීන් 06 දෙනෙකු, ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ලේකම් ඇතුළු නිලධාරීන් 04 දෙනෙකු, ආණ්ඩුකාරවරයාගේ කාර්යාලයේ ආණ්ඩුකාරතුමා ඇතුළු නිලධාරීන් 03 දෙනෙකු ද, අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ඇතුළු නිලධාරීන් 04 දෙනෙකු ලෙස වටිනාකම	ඉදිරියේදි බඩුමලු ලබාදිමේදි එම ප්‍රතිලාභය ලැබිය යුත්තේ කුමන පාර්ශ්වයට යන්න නැවත සළකා බලා කටයුතු කරන බව දන්වා සිටිමි.	ප්‍රඥප්තියේ සඳහන් අරමුණු සඳහා වියදම් දැරිය යුතුය.

රු.165,070 ක් වූ බඩුමළු 17 ක් ද ඒ තුළ ලබා දී තිබුණි. ඊට අමතරව අනෙකුත් බඩු මලු 543 බෙදාදුන් නිලධාරීන්/සේවකයන්ගේ නාම ලේඛන විගණනයට ඉදිරිපත් කර තිබුණ ද එය ක්‍රමවත්ව විධිමත්ව ඉදිරිපත් කර නොතිබුණ අතර 2024.12.31 දිනට ස්ථිර, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවයෙන් නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය 368ක් වන බැවින් බඩු මළු 192ක් අතිරික්තව ලබා ගෙන තිබූ අතර එම බඩු මළු වල වටිනාකම රු. 1,864,320 ක් විය.

1.5.14 ශීර්ෂය 580 - මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2019 හි 02. I ඡේදය සහ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13 : 2 උප වගන්තිය ප්‍රකාරව සෑම මූලික විමර්ශනයක්ම නොපමාව ඉටු කිරීමට අදාල පාර්ශව වගබලා ගත යුතු වුවද පළාත් කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කරන ලද මූලික විමර්ශන 02 කට අදාලව පරීක්ෂණ කටයුතු වර්ෂ 05 ක් සහ වර්ෂ 10 ක් ගත වී තිබියදීත් අවසන් කර නොතිබුණි.	මේ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු වන බව පෙන්වා දෙමි.	චක්‍රලේඛ සහ ආයතන සංග්‍රහයේ වගන්ති පරිදි කටයුතු කළ යුතුය.

1.5.15 ශීර්ෂය - 581202 පේෂකර්ම වැඩපොල පිහිටුවීම හා පරිපාලන පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වර්ෂ 05 ඉක්මවූ මුළු ණයගැති ශේෂය වූ රු.11,933,833ක් නිරවුල් නොකර පැවතුණි. එම ණයගැති ශේෂය තුළ වූ 2017 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රු.11,729,885ක ණයගැති ශේෂයන්ගෙන් කිසිදු මුදලක් 2024 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2010 ට පෙර පවතින ණයගැති ශේෂ සම්බන්ධයෙන් මු.රෙ 104(4) ප්‍රකාර පරීක්ෂණයක් සිදුවෙමින් පවතින අතර එම පරීක්ෂණයේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරමි.	ණයගැති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වර්ෂ 05	හඳුනාගත හැකි මුදල් ගෙවීමටත්, ඉතිරි ප්‍රමාණයන් රජයේ ආදායමට බැර කිරීමටත් කටයුතු කරමි.	ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

ඉක්මවූ මුළු ණයගිම් ශේෂය වූ රු.944,002 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර එම ණයගිම් ශේෂයෙන් කිසිදු මුදලක් 2024 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.5.16 ශීර්ෂය 591 - මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් නාලන්ද දිස්ත්‍රික් කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වෙත රු.17,876,476 ක විද්‍යාගාර උපකරණ හා ද්‍රව්‍ය ලබා දී තිබුණද එම උපකරණ හා ද්‍රව්‍ය භාවිතයට නොගෙන සමාලෝචිත වර්ෂය වන විට වර්ෂ 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණි.	රසායනික පොහොර භාවිතයෙන් ඉවත්ව කාබනික පොහොර භාවිතය සඳහා යොමු කරවීමේ රාජ්‍ය ප්‍රතිපත්තිමය වැඩසටහනට අනුව උපකරණ හා රසායනික ද්‍රව්‍ය ලැබී ඇති බවත් රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් වීම නිසා කොම්පෝස්ට් භාවිතය හා අලෙවිය අඩුවී ඇති බව දන්වමි.	වත්කම් ඵලදායී ව උපයෝජනය කළ යුතුය.
(ආ)	මධ්‍යම පළාත තුළ යහපත් කෘෂි පිළිවෙත් තුළින් සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක කෘෂි නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2023 වර්ෂයේ සිට GAP ගම්මාන වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ යටතේ තෝරාගත් ගොවීන් විසින් තාක්ෂණික කමිටු පිරිවිතර අනුව මිලදී ගත් ද්‍රව්‍ය හා උපකරණ වෙනුවෙන් එම උපකරණ වල වටිනාකමින් සියයට 50 ක් හෝ උපරිමය රු.50,000කට යටත්ව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අදාල ගොවියාට ගෙවීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ ගොවීන් 126 දෙනෙකු විසින් අදාල ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන වසරක කාලයක් ගත වී තිබුණ ද රජයේ දායකත්වය වශයෙන් රු.3,842,272 ක් අදාල ගොවීන්ට ගෙවා නොතිබුණි.	මේ වන විට එම මුදලින් රු.ලක්ෂ 10ක මුදලක් ගොවීන්ගේ ගිණුම් වෙත බැර කර ඇති බව දන්වන ලදී. ඒ අනුව තවදුරටත් රු.2842271.87 මුදලක් ගොවීන් වෙත ගෙවීමට ඉතිරි වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	ගොවීන්ට මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.

1.5.17 ශීර්ෂය 592 – මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කළ මුළු ගව / මී ගව ගොවිපල් සංඛ්‍යාව 24,126 ක් වුවත් ඉන් සක්‍රිය ගොවිපල් ගණන 6,480 ක් වූයෙන් ගොවිපල් 17,646 ක් හෙවත් සියයට 73ක් අක්‍රියව පැවතුණි. 2022 වර්ෂයේ එළගව, මීගව, එළු හා බැටළු ගොවිපල සංඛ්‍යාව 24,008 ක් වූ අතර 2023 වර්ෂයේ එය 11,112 ක් වීමෙන් 2023 වර්ෂයේදී එම ගොවිපල සංඛ්‍යාව 12,896 කින් අඩු වී තිබුණි. එමෙන්ම දේශිය කිරි නිෂ්පාදනයට ප්‍රධාන දායකත්වයක් සපයන එළ ගව හා මීගව ගොවිපල සංඛ්‍යාව 2022 වර්ෂයේ දි 11,338 ක් වූ අතර එය 2023 වර්ෂයේ දි 7,239 ක් වූයෙන් එම ගොවිපල සංඛ්‍යාව 4,099 කින් එනම් සියයට 36 කින් අඩු වී තිබුණි.	සත්ත්ව පාලනයේ යෙදීම පෞද්ගලික ව්‍යවසායකත්වයකි. ආර්ථිකමය වශයෙන් ලාභදායී තත්වයන් ඉහල යන අවස්ථාවලදී සත්ත්ව පාලනයට නැඹුරුවීම ස්වභාවිකව සිදුවන්නකි. මෙම දෙපාර්තමේන්තුව මගින් සත්ත්ව පාලනයේ යෙදෙන ගොවිපල වෙත සේවා සැපයීම සිදු කරනු ලබන අතර එම සේවා සැපයීම කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා දැඩි නිලධාරි හිඟයක් පවතින බව දන්වමි.	සත්ව පාලනයේ යෙදෙන ගොවීන් එම කර්මාන්තයේ රඳවා ගැනීම කෙරෙහි සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ඇතුලත් සමාජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය (EGSD) යටතේ පශු වෛද්‍ය සේවා පුළුල් කිරීමේ අරමුණින් අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හැටන් හා තලවාකැලේ පශු වෛද්‍ය කාර්යාලවලට Oxfam පෞද්ගලික ආයතනය මඟින් රසායනාගාර ගොඩනැගිලි ඉදි කර රසායනාගාර උපකරණ ලබා දි තිබුණි. ඉන් හැටන් පශු වෛද්‍ය කාර්යාලය සඳහා රු.4,152,631ක් වැය කර ඉදිකර තිබුණු වර්ග අඩි 787.44 ක ගොඩනැගිල්ලේ වසර 4ක කාලයක් ගත වී තිබුණද රසායනාගාර සේවා පවත්වා නොතිබුණි. මෙම ගොඩනැගිල්ලේ කිරි හා ගොම ආශ්‍රිත රසායනික පරීක්ෂණ පැවැත්වීම සඳහා 2020 අගෝස්තු 18 වන දින ලබා දී තිබූ රසායනාගාර උපකරණ 24 න් 16 ක් භාවිතයට නොගෙන තිබුණි.	ගොඩනැගිල්ල සැදීමේදී ජලය නිසිලෙස බැහැරවීමට පිළියමක් යොදා නැති බවත් ගොඩනැගිල්ල හැකි පමණින් නඩත්තු කරන බවත් රසායනාගාර උපකරණ හා භාවිතයට නොගන්නා භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු ආයතන තෝරා ලබා දීමට කටයුතු කරන බව දන්වමි.	වත්කම් වල ආරක්ෂාව තහවුරු කර ගත යුතු අතර උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

1.5.18 ශීර්ෂය 593 – මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 ඔක්තෝබර් 04 දිනැති අංක 2091/51 දරන අති විශේෂ ගැසට් පත්‍රය මෙම ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන	සමාලෝචන වාර්තාව හා කෙටුම්පත් ගැසට් නිවේදනය මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා	වාරිමාර්ග ප්‍රඥප්තියේ සඳහන් පරිදි කටයුතු කල

ලද 2017 අංක 05 දරන මධ්‍යම පළාත් වාරිමාර්ග ප්‍රඥප්තිය ගැසට් කර වසර 07 ක් ගත වී තිබුණ ද ප්‍රඥප්තියේ II කොටසේ 7(5) ඡේදය ට අනුව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වන වාරි ක්‍රම ගොවිජන සේවා හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් හෝ හඳුනාගෙන ගැසට් කර නොතිබුණි.

ගැනීම සදහා යොමු කර ඇති අතර, යුතුය. අනුමැතිය ලද වහාම ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.